# පළාත් සභා මැතිවරණ නීති

සැකසුම : නීතීඥ සදුන් ගුණවර්ධන

2013 ජූලි

පැෆ්රල්
නිදහස් සහ සාධාරණ මැතිවරණයක් සඳහා වූ
ජනතා ක්‍රියාකාරීත්වය
12/3, රොබට් ටෙරස්, රොබට් ගුණවර්ධන මාවත, කොළඹ 06
දුරකථන : 011 2514441/2
ෆැක්ස් : 011 2514443
ඊමේල් : paffrel@sltnet.lk
වෙබ් අඩවිය : www.paffrel.lk

## පටුන


| | පිටුව |
|---|---|
| ප්‍රාරම්භය | 02-17 |
| මැතිවරණ වැරදි | 18-30 |
| ඡන්ද විමසීම | 31-43 |
| ඡන්ද ගණන් කිරීම | 44-54 |
| ඡන්ද පෙත්සම් | 55-59 |
| ඇමුණුම | 55 |

# පෙරවදන

ලාංකීය මැතිවරණ ශබ්දකෝෂයට පළාත් සභා යනුවෙන් නව වචනයක් එක්වූයේ 1987 වසරේදී ගෙන එන ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟිනි. බලය විමධ්‍යගත කිරීම පිලිබඳ දීර්ඝ කාලීනව පැවති රාජ්‍ය ප්‍රතිසංස්කරණ කතිකාව එය බිහිවීමේ ප්‍රධාන හේතුවයි. එතෙක් පටන් අද දක්වාම ජනතාවගේ පරමාධිපත්‍යය බලය පළාත් මට්ටමින්ද අභ්‍යාස කිරීමට ජනතාවට අවස්ථාව ලැබී ඇත. එම අවස්ථාව උපරිම අයුරින් සුරක්ෂිත කිරීමට දායක වීම අපගේ කාර්යභාරයයි. 1993 වසරේ පැවති පළාත් සභා මැතිවරණයේ සිට සෑම පළාත් සභා මැතිවරණයක්ම අප විසින් නිරීක්ෂණය කර ඇත.

ජනතාව කවර දේශපාලන විශ්වාසයක් දරුවද ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයක් තුල රටේ පාලනයට හවුල් වීමේ අනුල්ලංඝනීය අයිතියක් ඔවුන්ට හිමිය. ප්‍රචණ්ඩත්වය, නීතිය නොසලකා හැරීම, අල්ලස, දූෂණය, රාජ්‍ය බලය අයථා ලෙස භාවිතය වැනි නිර්ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාකාරකම් ජනතාවගේ එම අයිතිය පැහැර ගනී.

තම මූලික අයිතියක් වන ඡන්ද බලය රැක ගැනීමට නම් නිදහස් සහ සාධාරණ මැතිවරණයක් වෙනුවෙන් කොන්දේසි විරහිතව සංවිධානය විය යුතු බව අපගේ විශ්වාසයයි. කෙතරම් නීති පැවතියත් ජනතාව තම අයිතීන් රැකගනීමට ඉදිරිපත් වනතුරු ඒවා සුරක්ෂිත වීම උගහටය.

ඒ සඳහා එක් ප්‍රමුඛ කොන්දේසියක් වන්නේ තමන්ට බලපාන නීතිය තමන් විසින් දැන සිටීමයි. මෙම මැතිවරණ නීති අත්පොත බිහිවන්නේ එම අවශ්‍යතාවය වෙනුවෙනි. මෙය මැතිවරණ නිරීක්ෂකයින්ට මෙන්ම තම ඡන්ද අයිතිය ගැන උනන්දුවක් දක්වන සියලු දෙනාට ප්‍රයෝජනවත් වනු ඇතැයි අප විශ්වාස කරමු.

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ
නිදහස් සහ සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වය

# ප්‍රාරම්භය

## පළාත් සභා

පළාත් සභා ක්‍රමය මුල්වරට ශ්‍රී ලංකාවට 1987 වර්ෂයේදී හඳුන්වාදෙන ලද අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවූයේ ශ්‍රී ලංකා රජය හා ඉන්දියානු රජය අතර වර්ෂ 1987 ජූලි මස 29 වන දින අත්සන් කරන ලද ඉන්දු - ශ්‍රී ලංකා සාම ගිවිසුමයි. මෙකී ඉන්දු - ශ්‍රී ලංකා සාම ගිවිසුමෙහි මූලික අරමුණ වූයේ 80 දශකය මුල් භාගයේ ආරම්භ වී එකී ගිවිසුම අත්සක් කරනු ලැබූ කාල පරිච්ජේදය වන විට වඩා තීව්‍ර වෙමින් පැවති සිවිල් යුධ තත්වය සමනය කරනු පිණිස තිරසාර විසඳුමක් ලබා දීම විය.

1987 වර්සයේදී ශ්‍රී ලකා රජයේ හමුදාවන් විසින් එල්. ටී. ටී. ඊ. සංවිධායට එරෙහිව විශාල පරිමාණයේ යුධ ක්‍රියාන්විතයක් ආරම්භ කරන ලද අතර මෙම තත්වය විශේෂයෙන් දකුණු ඉන්දියාව තුල දැඩි උණුසුම්කාරී තත්වයක් උද්ගත කිරීමට හේතු වන ලද අතර එකල පැවති ජ්‍යාත්‍යන්තර දේශපාලන හේතුද මත ඉන්දියානු රජය මෙම ගැටලුවට සෘජු ලෙස හා මත භේදකාරී ලෙස මැදිහත් වන ලද අතර දෙමල ජනතාව තුල පවතින අසහනකාරී තත්ත්වය නැතිකිරීම සඳහා ඇති එකම පිළියම බලය බෙදීම පමණක්ය යන්න ඉන්දීය රජයේ දැඩි  මතය විය.

ඒ අනුව බලය බෙදිම හා අනෙකුත් අවශ්‍යතා ඉටු කිරීම වස් 1978 ආන්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරිම අවශ්‍ය වූ අතර මෙකි අරමුණු ඉටු කිරීම පිණිස 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එන ලදී.

ප්‍රධාන වශයෙන් 1978 ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 18 වන වගන්තිය සංශෝධනය කරමින් දෙමළ භාෂාව නිල භාෂාවන් ලෙස පිළිගන්නා ලද අතර 138 වන වගන්තිය සංශෝධනය කරමින් ඒ ඒ පළාත සඳහා පළාත් මහාධිකරණය බැගින්ද පිහිටුවනු ලැබීය.

වඩාත්ම වැදගත් සංශෝධනය වූයේ  1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අලුතින් එක් කරන ලද 154 වන වගන්තියයි එමගින් ශ්‍රී ලංකාව පළාත් 9 කට වෙන් කර ඒ එක් එක් පළාත සඳහා පළාත් සභාව බැගින් පිහිටුවනු ලැබීය මෙම පළාත් සභාවලට අදාල බලය පිළිබදවද පැහැදිලි කිරීමක් එකී සංශෝධනයේ 9 වන උපලේඛනයේ දක්වනු ලැබූ අතර එකී බලයන් කොටස් 3 ක් යටතේ වෙන් කරනු ලැබ තිබුනි.

පළාත් සභාවලට පමණක් අදාල බලයන් පළාත් සභා ලැයිස්තුවේ දක්වන ලද අතර මෙම විෂයන්ට අදාල ප්‍රඥප්ති සෑදීමේ ලබය පළාත් සභා පමණක් සතු වන ලද අතර සමගාමී ලැයිස්තුවේ අදාල විෂයන් සම්බන්ධ බලය පොදුයේ පළාත් සභා හා පාර්ලිමේන්තු යන ආයතය දෙකටම පොදුවේ හිමිවන ලදි. සංවෘත ලැයිස්තුවට අදාල විෂයන් සම්බන්ධ බලය පාර්ලිමේන්තුව පමණක් සතු වන ලදී. (ඇමුණුම 1 බලන්න)

මෙම 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හදිසි කෙටුම්පතක් ලෙස ගෙන එන ලද අතර ඒ අනුව මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසීම ජනාධිපතිවරයා විසින් සිදු කරනු ලබන ලද අතර ඒ අවස්ථාවේදී එයට විරුද්ධව පෙත්සම් ශ්‍රේෂ්ඨාධිකරණය වෙතද ඉදිරිපත් කරනු ලැබ තිබූ හෙයින් මෙම සම්බන්ධයෙන් දෙපාර්ශවයේ කරුණු විමිසීමකින් අනතුරුව සංශෝධනවලට යටත්ව එයට ශ්‍රේෂ්ඨාධිකරණයේ අනුමැතිය හිමිවල ලදී. නමුත් මෙම නඩු තීන්දුව ශ්‍රීලංකා අධිකරණ ඉතිහාසයේ වඩාතම තකාබහට ලක්වූ නඩු තීන්දුව වන අතර අද දක්වාම එකී නඩු තීන්දුව සම්බන්දධයෙන් දැඩි මතභේද කාරී තත්වයක් පවතී. (ඇමුණුම බලන්න)

කෙසේ වුවද එකී සශෝධනය ප්‍රකාරව පළාත් 9 කට වෙන් කරනු ලබන ලද අතර ඒවා නම්,

1 උතුරු පලාත - යාපනය,මන්නාරම,වව්නියාව,මුලතිව්, කිලිනොච්චි

2 නැගෙනහිර පලාත - ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර

3 උතුරුමැද පලාත - අනුරාධපුර, පොලෙන්නරුව

4 මධ්‍යම පලාත - මහනුවර, මාතලේ, නුවරඑළිය

5 ඌව පලාත - බදුල්ල, මොණරාගල

6 සබරගමු පලාත - කෑගල්ල, රත්නපුර

7 වයඹ පලාත - පුත්තලම, කුරුණෑගල

8 බස්නාහිර පලාත - කොලඹ, ගම්පහ, කළුතර

9 දකුනු පලාත - ගාල්ල, හම්බන්තොට, මාතර

මෙලෙස පළාත් නමයක් ලෙස දක්වා තිබුණද පළාත් සභාවන් වශයෙව් පිහිටුවා තිබුනේ පළාත් අටක් සඳහා පමණි. ඒ උතුරු නැගෙනහිර දෙපළාත ඒකාබද්ධ පළාතක් ලෙස සැලකා එකී දෙපළාත සදහා


තනි පළාත් සභාවක් පිහිවුවන ලදී. නමුත් 2006 වර්ෂයේදී ජේ .ආර් . ජයවර්ධන ජනාධිපත්වරයාගේ එකී වර්ෂ 1988 පෙබරවාරි 2 වන දින කරන ලද නියෝගය අභියෝගයට ලක්කරමින් නඩුවක් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පවරන ලද අතර එහිදී තීරණය කරන ලද්දේ එලෙස පළාත් සභා දෙකක් එකලු කිරීම පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් වන බැවින් එකී තීරණය බලරහිත එකක් වන බවයි . ඒ අනුව නැවත උතුරු - නැගෙනහිර එක් පළාතක් ලෙස නොව පළාත් දෙකක් ලෙස සලකා පළාත් සභා පිහිටුවිය යුතු බවට තීරණය කරන ලදී .

යාපනය, මන්නාරම, වව්නියාව, මුලතිව්, කිලිනොච්චි යනුවෙන් දිස්ත්‍රික්ක 5 ක් වන ලෙසට උතුරු පලාත පිහිටුවා තිබුනද දැනට උතුරු පළාත යාපනය, කිලිනොච්චි හා වන්නි යන දිස්ත්‍රික්ක 3 ක් වන ලෙස සලකා මැතිවරණ පවත්වනු ලබයි .

## පළාත් සභා සඳහා අදාල වන නීතිය

1) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය
2) 1987 අංක 42 දරන පළාත්සභා පනත සහ එහි සංශෝධනයන්
3) 1988 අංක 02 දරන පළාත්සභා ඡන්ද විමසීම් පනත
   i. 1988 අංක 35 දරන පළාත්සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත
   ii. 1988 අංක 55 දරන පළාත්සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත
   iii. 1990 අංක 29 දරන පළාත්සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත
   iv. 1993 අංක 07 දරන පළාත්සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත
   v. 2004 අංක 05 දරන පළාත්සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත
4) මැතිවරණ කොමසාරිස්වරයා විසින් කලින් කලට නිකුත් කරන නියෝග, චක්‍රලේඛ සහ ගැසට් නිවේදන.

මෙම ග්‍රන්ථය මගින් ප්‍රධාන වශයෙන් සාකච්චා කරනු ලබන්නේ පළාත්සභා ඡන්ද විමසීමට අදාල වන 1988 අංක 02 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සහ එකී පනතට පසුව ගෙන එනු ලැබූ සංශෝධනයන් පමණි.


Northern
North Central
North Western
Eastern
Central
Western
Sabaragamuwa
Uva
Southern

1. <u>උතුරු පළාත</u>

යාපනය, වන්නි,

කිළිනොච්චි



2. <u>නැගෙනහිර පළාත</u>

ත්‍රිකුණාමලය


මඩකලපුව, අම්පාර



3. <u>උතුරුමැද පළාත</u>

අනුරාධපුර

පොළොන්නරුව



4. <u>මධ්‍යම පළාත</u>

මහනුවර, මාතලේ

නුවරඑළිය



5. <u>ඌව පළාත</u>

බදුල්ල, මොනරාගල



6. <u>සබරගමු පළාත</u>

කෑගල්ල, රත්නපුර



7. <u>වයඹ පළාත</u>

පුත්තලම, කුරුණෑගල



8. <u>බස්නාහිර පළාත</u>

කොළඹ, ගම්පහ, කළුතර



9. <u>දකුණු පළාත</u>

ගාල්ල, හම්බන්තොට

මාතර





<u>ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කිරීම</u>

## පළාත් සභාවේ මන්ත්‍රීවරු

(3 සහ 61 (අ) වගන්තිය, 1987/42 පළාත්සභා පනත සහ 2004/05 සංශෝධනය)

පළාත් සභාවක මන්ත්‍රී සංඛ්‍යාව 1987 අංක 42 පනතේ 02 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් තීරණය කරයි. එම තීරණය ගැනිමේදි ඒ ඒ පළාතේ භූමි ප්‍රමාණය සහ ජනගහනය සලකා බැලිය යුතුය.

එම ගණන පදනම් කර ගනිමින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් එකී මන්ත්‍රි සංඛ්‍යාව පිලිබඳව දැන්වීමක් නිකුත් කරනු ලබයි.

එසේ තීරණය කරන සංඛ්‍යාවට අමතරව එක් එක් පළාතේ වැඩිම ඡන්ද ප්‍රමාණයක් ලබන දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට බෝනස් ආසන දෙකක්ද හිමිවේ.

ඒ ආසන දෙක සඳහා නාමයෝජනා පත්‍රයේ දැක්වෙන නමුත් තේරී පත් නොවූ අපේක්ෂකයින් අතුරින් දෙදෙනෙකු නම් කිරීම දේශපාලන පක්ෂයක නම් එහි ලේකම්වරයාද ස්වාධීන කණ්ඩායමක නම් එහි නායකයා විසින්ද සිදු කල යුතුය.

## ඡන්ද ප්‍රදේශය සහ ඡන්ද කොට්ඨාශය (4 වගන්තිය)

1980 අංක 44 දරණ ඡන්ද හිමියන් ලියාපදිංචිකිරීමේ පනත යටතේ වර්තමානයේ බලපවත්නා ඡන්ද ප්‍රදේශ සහ ඡන්ද කොට්ඨාශ (ඡන්දපොළ ප්‍රදේශය) පළාත් සභා ඡන්ද විමසීම සඳහා යොදා ගැනේ. සෑම පරිපාලන දිස්ත්‍රික්කයක්ම ඡන්ද විමසීම සඳහා ඡන්ද ප්‍රදේශයක් ලෙස සැලකේ.

## ඡන්ද හිමි නාම ලේඛනය (5 වගන්තිය)

නාමයෝජනා පිළිබඳ දැන්වීම කරන අවස්ථාවේ ක්‍රියාත්මකව පැවති ඡන්ද හිමි නාම ලේඛනය මේ සඳහා යොදා ගැනේ.

යමෙකු ඡන්දය දීමට හිමිකම් ලබන්නේද නැද්ද යන්න නිශ්චය වන තීරණාත්මක සාක්ෂිය වන්නේ 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචිකිරීමේ පනත යටතේ සාදන ඡන්ද හිමි නාම ලේඛනයයි. එනම් එම ලේඛනයේ නම් තිබෙන සියළු දෙනා ඡන්දය දීම සඳහා සුදුස්සෝ වෙති.

## තේරීම්භාර නිලධාරීන් (7 වගන්තිය)

මැතිවරණ කොමසාරිස්වරයා විසින් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා තේරීම්භාර නිලධාරියෙකු සහ ඔහුට සහය වීම පිණිස සහකාර තේරීම්භාර නිලධාරීන් කිහිප දෙනෙකු පත් කරනු ලැබේ.

තේරීම්භාර නිලධාරියා ලෙස පත් කරන්නේ දිස්ත්‍රික් ලේකම්වරයා (දිසාපති) වේ. සහකාර තේරීම්භාර නිලධාරියෙකුද වන සහකාර මැතිවරණ කොමසාරිස්වරයා අදාල දිස්ත්‍රික්කයේ මැතිවරණ කටයුතු සංවිධානය කිරීම පිළිබඳ ප්‍රධාන වගකීම දරනු ලැබේ.

## පළාත් සභා මන්ත්‍රීවරයෙකු වීමට නුසුදුසුකම් (9 වගන්තිය)

(1987 අංක 42 පළාත් සභා පනතේ 3 වගන්තිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 වගන්තියද අදාල වේ)

1 ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන්නන්

2 අවුරුදු 18 සම්පූර්ණ නොවූවන්

3 සිහිවිකල තැනැත්තෙක් ලෙස නීතියෙන් තීරණය කර ඇති තැනැත්තන්

4 වසර දෙකකට බන්ධනාගාර ගත කල හැකි වරදකට මාස හයක කාලයකට හෝ සිරදඬුවම් නියමව සිටින්නන්, මරණ දන්ඩනය වෙනුවට සිරදඬුවමක් විඳිමින් සිටින්නන් සහ පසුගිය වසර හත ඇතුලත එම දඬුවම සම්පූර්ණයෙන් විඳ ඇති තැනැත්තන්

★ කොන්දේසි සහිත සමාවක් ලැබූ අයට අපේක්ෂකත්වය ලැබීමට බාධාවක් නැත.

5 ජනමතවිචාරණයකදී, ජනාධිපතිවරණයකදී, පාර්ලිමේන්තු මැතිවරණයකදී නීතිවිරෝධී හෝ දූෂණ ක්‍රියාවකට හෝ අල්ලස් චෝදනාවකට වරදකරු කර එකී දිනයේ සිට වසර හතක් නොඉක්මවූ තැනැත්තන්

6 පළාත් පාලන ඡන්ද විමසීම් පනත යටතේ වරදකරුවකු කරනු ලැබ වසර පහක් නොඉක්මවූ තැනැත්තන්

7 රාජය ආයතනයක දූෂණ ක්‍රියාවන්ට වරදකරුවකු කරනු ලැබ

වසර පහක් නොඉක්මවූ තැනැත්තන්

8 ජනමතවිචාරණ, ජනාධිපතිවරණ, පාර්ලිමේන්තු ඡන්ද විමසීමකදී නීතිවිරෝධී ක්‍රියාවකට අනුරූප වරදකට වරදකරුවකු කරනු ලැබ වසර තුනක් නොඉක්මවූ තැනැත්තන්

9 ප්‍රජා අයිතිය අහිමි කරනු ලැබ එකී කාලය අවසන් වී නැති තැනැත්තන්

10 බොරු සාක්ෂි දීම, වරදක තොරතුරු දැනුම් නොදීම, වරදක් පිළිබඳ අසත්‍ය තොරතුරු සැපයීම, සාක්ෂි සඳහා අවශ්‍ය විය හැකි ලේඛන/ද්‍රව්‍ය විනාශ කිරීම වැනි වරදකට වරදකරුවකු කරනු ලැබ වසර හතක් නොඉක්මවූ තැනැත්තන්

11 විශේෂ ජනාධිපති කොමිසමක් ඉදිරියේ පෙනී නොසිටීම, එහි නියෝගයක් ප්‍රතික්ෂේප කිරීම, අසන ලද ප්‍රශ්න වලට පිලිතුරු නොදීම, කොමිසමට අපහාස කිරීම ආදී වරදකට වරදකරුවකු කරනු ලැබ වසර හතක් නොඉක්මවූ තැනැත්තන්

12 ජනාධිපතිවරයා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, හෝ වෙනත් පළාත් සභාවක මන්ත්‍රීවරයෙක් වන තැනැත්තන්

13 අධිකරණ නිලධාරීන්

14 පරිපාලන කටයුතු පිලිබඳ පාර්ලිමේන්තු ලේකම්වරයා (ඔම්බුඩ්ස්මන්)

15 පාර්ලිමේන්තු මහලේකම්වරයා හෝ ඔහුගේ කාර්ය මණ්ඩලය

16 රාජ්‍ය සේවා කොමිෂන් සභා සාමාජිකයින්

17 මැතිවරණ කොමසාරිස්වරයා

18 විගණකාධිපතිවරයා

19 1970 නොවැම්බර් 18 දිනට පෙර හෝ පසු ඇතිකල ධූරයක එදින වනවිට රුපියල් 6720 ක් හෝ පසුකාලයක ඊට අනුරූප වූ වැටුපක් ගන්නා රජයේ නිලධාරියෙක්

20 1970 නොවැම්බර් 18 දිනට පෙර හෝ පසු ඇතිකල ධූරයක එම ධූරය ආරම්භක දින වනවිට රුපියල් 7200 ක් හෝ පසුකාලයක ඊට අනුරූප වූ වැටුපක් ගන්නා රාජ්‍ය සංස්ථා නිලධාරියෙක්

21 ත්‍රිවිධ හමුදාවේ නිලධාරින්

22 පොලිස් නිලධාරීන්, ග්‍රාම නිලධාරීන් සහ එම කාර්යය ඉටු කරන රාජ්‍ය නිලධාරීන්

23 රජයේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක් සමග ගිවිසුමකට

එලඹ සිටින්නන්

24 වස්තුභංගත්වයට පත්වූවන් ලෙස ප්‍රකාශ කල තැනැත්තන්

25 ගතවූ වසර හතක් තුල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කිරීමේදී අල්ලස් ගත් අයෙක් බව අධිකරණයෙන් හෝ ජනාධිපති කොමිසමකින් තීරණය කල තැනැත්තන්

26 පළාත් පාලන මැතිවරණයකදී ඡන්දය දීමට නොහැකි තැනැත්තන්

27 පළාත් සභා දෙකක හෝ ඊට වැඩි ගණනක අපේක්ෂකත්වය ඉල්ලා සිටින්නන්

28 පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කන්ඩායම් එකකට වැඩි ගණනකින් නාම යෝජනා කර ඇති තැනැත්තන්

## නාම යෝජනා (10/11 වගන්ති)

පළාත් සභාවක් විසුරුවා හැරීමෙන් සතියක් ඇතුළත ඡන්දයක් පැවැත්වීම සඳහා පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් වලින් නාමයෝජනා කැඳවිය යුතුය.

ඒ ඒ පළාත් සභාවේ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය සඳහා තෝරා පත් කර ගැනීමට නියමිත නියෝජිතයන් ගණන සහ ඒ සඳහා නාමයෝජනා ඉදිරිපත් කළ යුතු දින හා කාල සීමාවන් දක්වා දැන්වීමක් මැතිවරණ කොමසාරිස්වරයා විසින් පළ කළ යුතුය.

නාම යෝජනා භාර ගනුයේ ඉහත කී පරිදි දන්වීම් පළ කළ දිනයෙන් පසුව එලඹෙන 14 වන දිනයෙන් පටන්ගෙන එම දැන්වීම් පලකල දිනයෙන් පසුව එන 21 වන දිනයේ දහවල් 12 න් අවසන් වන දින හත තුළදීය.

නාම යෝජනා පත්‍රයක් භාර ගැනීම ප්‍රතික්ෂේප කළහොත් තේරීම් භාර නිලධාරියා එය ඉදිරිපත් කළ තැනැත්තාට ඒ බව දැනුම් දිය යුතුය.

දූෂණ ක්‍රියාවකට වරදකරු වීම හේතුවෙන් හෝ පාර්ලිමේන්තු හෝ ජනාධිපතිවරණ පෙත්සම් විභාගයකදී වරදකරුවකු වීම නිසා හෝ ප්‍රජා අශක්නුතාවකට ලක්ව සිටීම නිසා අපේක්ෂයකු වීමට තමා නුසුදුසු බව දැනදැනම නාමයෝජනා පත්‍රයක නම ඇතුළත් කළ තැනැත්තෙකු වරදකරුවකු වන අතර රු. 1000 ක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් දක්වා සිරදඬුවමකට යටත්වීමට සිදුවේ.

පිළිගත් දේශපාලන පක්ෂයක්/කණ්ඩායමක් අතර එහි අයිතිය පිළිබඳ ආරවුලක් පවතින අවස්ථාවක පිළිගන්නේ කවරකුද යන්න තීරණය කිරීමේ බලය මැතිවරණ කොමසාරිස්වරයාට තිබේ. මැතිවරණ කොමසාරිස්වරයාගේ තීරණය ඒ ඒ දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරීන්ට දන්වමින් විධානයක් කළ යුතුය. ඊට විරුද්ධව කිසිම අන්දමකින් හෝ නඩුවක් පැවරිය නොහැකිය.

## නාම යෝජනා පත්‍ර සකස් කළ යුතු ආකාරය (13 වගන්තිය)

(අ) ඉදිරිපත් කළ යුත්තේ එක් නාම යෝජනා පත්‍රයක් හා එහි එක් පිටපතක් පමණි.

(ආ) නාම යෝජනා පත්‍රය පළමු උපලේඛනයේ 'අ' ආකෘතියට අනුව සකස් කල යුතුය.

(ඇ) අදාල පරිපාලන දිස්ත්‍රික්කයෙන් තෝරා ගැනීමට නියමිත මන්ත්‍රීවරයන් ගණනට වඩා අපේක්ෂකයන් තිදෙනෙකුගේ නම් ඊට ඇතුළත් කර තිබිය යුතුය.

(ඈ) ඒ ඒ අපේක්ෂකයාගේ කැමැත්ත දැක්වීමට එහි අත්සන් කර තිබිය යුතුය.

(ඉ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හත්වන උප ලේඛනයේ දැක්වෙන ආකෘතිය අනුව දිවුරුම් ප්‍රකාශයක් හෝ ප්‍රතිඥාවක් අත්සන් කල යුතුය.

(ඊ) ස්වාධීන කණ්ඩායමක නාමයෝජනා පත්‍රය සමඟ එහි දැක්වෙන එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් රු. 2000 බැගින් වූ ඇප මුදල් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ද ඉදිරිපත් කල යුතුය.

(උ) දේශපාලන පක්ෂවල නාම යෝජනා පත්‍ර පක්ෂ ලේකම් විසින් ද, ස්වාධීන කණ්ඩායමක් නම් නාම යෝජනා පත්‍රයෙහි මුලට නම සඳහන් අපේක්ෂකයා විසින් ද අත්සන් කල යුතුය.

(ඌ) නාමයෝජනා පත්‍රය සමාදාන විනිසුරුවකු විසින් හෝ නොතාරිස්වරයෙකු විසින් සහතික කල යුතුය.

(එ) නාමයෝජනා පත්‍රය නියමිත වේලාව ඇතුළත දී තේරීම් භාර නිලධාරියා වෙත භාරදිය යුතුය.

(ඒ) පක්ෂයක් නම් එහි ලේකම්වරයා හෝ බලය ලත් නියෝජිතයා විසින්ද ස්වාධීන කණ්ඩායමක් නම් එහි මුලටම නම සඳහන් තැනැත්තා විසින්ද නාම යෝජනා පත්‍ර භාර දීම කල යුතුය.

යම් හේතුවක් නිසා ඉහත කී අයෙකුට නාම යෝජනා පත්‍රය භාරදීමට නොහැකි වන අවස්ථාවක අපේක්ෂක ලැයිස්තුවේ දෙවැනියට නම ඇතුළත් තැනැත්තාට එය භාර දිය හැක.

තේරීම් භාර නිලධාරියා විසින් තමන් විසින් භාරගත් නාම යෝජනා පත්‍ර පිටපත් තම දැන්වීම් පුවරුවෙහි ප්‍රදර්ශනය කළ යුතුය.

ඉදිරිපත් කරන ලද නාම යෝජනා පත්‍රයක යම් අත හැරීමක් හෝ ලිපි දෝෂයක් ඇතැයි එය ඉදිරිපත් කළ අයට පෙනී ගිය අවස්ථාවක නාම යෝජනා කාලය ඉකුත්වීමට පෙර එය නිවැරදි කිරීම සඳහා ඉල්ලීමක් කල හැක. එකී අත්හැරීම අනවධානය නිසා වූයේ යැයි සෑහීමට පත්වන විටක තේරීම්භාර නිලධාරියාට තමා ඉදිරිපිටදී එය නිවැරදි කිරීමට ඉඩදිය හැක.

එහෙත් අපේක්ෂකයෙකුගේ නමක් අත්හැරීම, අපේක්ෂකයෙකු සිය කැමැත්ත දැක්වීමට එහි අත්සන් කර නොතිබීම, දේශපාලන පක්ෂයේ ලේකම් විසින් හෝ කණ්ඩායම් නායකයෙකු විසින් අත්සන් කර නොතිබීම නැතහොත් සාමවිනිසුරුවෙකු හෝ නොතාරිස්වරයෙකු විසින් අත්සන් කර නොතිබීම යන වැරදි සකස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

## මුදල් තැන්පත් කිරීම (14/15/16 වගන්ති)

නාම යෝජනා පත්‍ර භාර ගනු ලබන අන්තිම දිනට පෙර දිනයේ දහවල් 12.00 ට පෙර ස්වාධීන කණ්ඩායමක් විසින් එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් රුපියල් දෙදහස (රු. 2000) බැගින් මුදලක් තේරීම් භාර නිලධාරියා වෙත තැන්පත් කර කුවිතාන්සිය ලබාගත යුතුය. එම කුවිතාන්සියෙහි,

1. මුදල් තැන්පත් කළ අයගේ නම
2. අපේක්ෂකයන් සංඛ්‍යාව
3. තැන්පත් කළ මුදල් ප්‍රමාණය
4. මුදල් තැන්පත් කළ දිනය හා වෙලාව සඳහන් විය යුතුය.

මෙම ගෙවීම ස්වාධීන කණ්ඩායම් නායකයා හෝ ඔහු විසින් බලය දුන් අයෙක් විසින් කල යුතුය. කිසිම හේතුවක් නිසා නියමිත කාල සීමාවට පෙර හෝ පසුව ද, බලය නොමැති අයකු විසින් ද කරනු ලබන මුදල් තැන්පත් කිරීම් භාරනොගනී.

පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් ඇපයක් ලෙස කිසිම මුදලක් තැන්පත් කළ යුතු නැත.

ස්වාධීන කණ්ඩායම් නාම යෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් ඔවුන්ගේ ඇප මුදල නැවත ලබා දිය යුතුය. එමෙන්ම ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව එක් අපේක්ෂකයෙක් හෝ තේරී පත්වීම නිසා ඇප මුදල රාජසන්තක නොවුවහොත් ඒ මුදල් හැකි ඉක්මනින් එම කණ්ඩායමට දිය යුතුය.

# නාම යෝජනා පත්‍රයේ ආකෘතිය

.........................................................................................
........................................................... පළාත් සභාවේ ...........
............................................... පරිපාලන දිස්ත්‍රික්කය සඳහා වූ නාම යෝජනා පත්‍රය යි. පිළිගත් දේශපාලන පක්ෂයක්/ස්වාධීන අපේක්ෂක කණ්ඩායමක් වන ..................................................... ......... විසින් මෙහි පහත නම් සඳහන් තැනැත්තන් ඉහත සඳහන් පරිපාලන දිස්ත්‍රික්කයෙන් පළාත් සභාවේ මන්ත්‍රීවරුන් වශයෙන් තෝරා පත් කර ගැනීම සඳහා අපේක්ෂකයන් වශයෙන් මෙයින් නාම යෝජනා කරනු ලැබේ.

1. අපේක්ෂකයාගේ නම
2. ලිපිනය
3. රක්ෂාව
4. තමාගේ කැමැත්ත දක්වන සහ තෝරා පත් කර ගැනීම සඳහා කිසිම නුසුදුසුකමකට තමා යටත් නොවන බවට අපේක්ෂකයාගේ අත්සන

ඉහත නම් සඳහන් දේශපාලන පක්ෂයේ ලේකම්/කණ්ඩායම් නායකයා වන ............................ විසින් වර්ෂ ........................... ක් වූ ......................... දින වූ මෙදින .......................... දී මා ඉදිරියේ අත්සන් තබන ලදී.

.............................................. පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ගේ/කණ්ඩායම් නායකයාගේ අත්සන

නම : .....................................

ලිපිනය : ........................

.......................................................
සමාදාන විනිශ්චයකාරවරයා හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයා

## තරඟයක් නැති ඡන්දය (18 වගන්තිය)

යම් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා එක් අපේක්ෂක ලැයිස්තුවක් පමණක් පිළිගනු ලැබූ අවස්ථාවක එම ලැයිස්තුව නිතරඟයෙන් තේරීපත් වේ. ඉන්පසු එම ලැයිස්තුවෙන් මන්ත්‍රීවරුන් ලෙස තෝරා පත් කර යුත්තේ කවුරුන්දැයි ඒ නාම යෝජනා පත්‍රය ඉදිරිපත් කළ පක්ෂ ලේකම්වරයාගෙන් හෝ ස්වාධීන කණ්ඩායම් නායකයාගෙන් විමසිය යුතුය. එසේ විමසීම් කළ විට පිළිතුරක් ලදහොත් ඒ අනුවද පිළිතුරක් නොළදහොත් ලැයිස්තුවේ අනුපිළිවෙල අනුවද නියමිත අපේක්ෂකයන් සංඛ්‍යාව තෝරා ගෙන ඔවුන් ඒ දිස්ත්‍රික්කය සඳහා පත් කරනු ලැබේ.

## නාමයෝජනා කිසිවක් නැති විට (19 වගන්තිය)

නියමිත කාල සීමාව තුළ එක් නාම යෝජනා පත්‍රයක්වත් පිළිනොගත් හෝ ඉදිරිපත් නොවූ අවස්ථාවක නාම යෝජනා කාලය ඉකුත් වී දින හතක් ඇතුළත දෙවන නාම යෝජනා සඳහා දිනයක් කොමසාරිස්වරයා විසින් නියම කළ යුතුය. දෙවනවර නාම යෝජනා භාර ගැනීම ඒ දැන්වීම පළ කරන දිනයේ සිට දින හතත්, දාහරත් (7-14) අතර කාලයක් තුළ විය යුතුය. අවසාන දිනයේ දවල් 12.00 ට නාම යෝජනා භාර ගැනීම අවසන් විය යුතුය.

## තරඟයක් ඇති ඡන්දය (20 වගන්තිය)

නාම යේජනා පත්‍ර දෙකක් හෝ ඊට වැඩි ගණනක් පිළිගනු ලැබූ අවස්ථාවක, ඒ ඒ පක්ෂයකට අනුමත කරන ලද ලකුණු වෙන් කර දිය යුතුය. ස්වාධීන කණ්ඩායම් වෙතොත් ඒවාට නියමිත අංක හා ලකුණු වෙන් කර දීමේදී කණ්ඩායම් නායකයන් අතර එකඟතාවකින් කළ නොහැකි වුවහොත් කුසපත් ඇදීම මගින් එය කළ යුතුය.

පක්ෂයකට වෙන් කරන ලද ලකුණක් කිසිම හේතුවක් නිසා වෙනත් පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ලබා ගත නොහැකිය.

නාම යෝජනා පත්‍ර ඉදිරිපත් කරනු ලබන අවස්ථාවට, පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම්ට, ඔහුගේ බලයලත් නියෝජිතයාට, ස්වාධීන කණ්ඩායම් නායකයාට, නාම යෝජනා පත්‍රයේ දෙවැනියට නම ඇති අපේක්ෂකයාට හා එක් එක් අපේක්ෂක ලැයිස්තුව වෙනුවෙන් තවත් එක් අයකුවත් පැමිණ සිටිමට බලය ඇත. (21 වගන්තිය)

නාම යෝජනා පත්‍ර භාර ගැනීමේ කටයුතු නිමවීමෙන් පසු තේරීම්භාර නිලධාරියා විසින් එක් එක් ලැයිස්තුවේ ඇති අපේක්ෂකයින්ගේ නම් සිංහල අකාරාදී පිළිවෙලට සකස් කර එක් එක් අපේක්ෂකයාට අනුක්‍රමික අංකයක් ලබා දිය යුතුය. එසේම ස්වාධීන කණ්ඩායම් හඳුනා ගැනීමේ අංකයක් ද දිය යුතුය.

පරිපාලන දිස්ත්‍රික්කයේ එක් එක් ඡන්ද කොට්ඨාශය සඳහා වන ඡන්ද පොළවල් පිහිටවනු ලැබේ නම් ඒවාද සඳහන් කරමින් ගැසට් පත්‍රයේ දැන්වීමක් පළ කළ යුතුය.

## ඡන්දයට පෙර අපේක්ෂකයෙකු මිය යාම (23 වගන්තිය)

නාම යෝජනා පත්‍ර භාර දුන් දිනයත්, ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයත් අතරතුරදී, යම් අපේක්ෂකයෙකු මිය ගියහොත් ඒ නිසා ඒ තැනැත්තාගේ නම ඇතුළත් අපේක්ෂක නාම ලැයිස්තුව අවලංගු වන්නේ හෝ අළුතින් නාමයෝජනා පත්‍ර භාර ගැනීමට සිදුවන්නේ නැත. නාමයෝජනා පත්‍රයේ අඩංගු කල අතිරේක නම් තුන අතුරින් එක් අයෙක් එම හිස්වූ අපේක්ෂකත්වය වෙනුවෙන් ආදේශ කරනු ලැබේ.

## මැතිවරණ වැරදි

## නාමයෝජනා පත්‍ර සහ ඡන්ද පත්‍රිකා සම්බන්ධ වැරදි (66/67 වගන්ති)

1 - නාම යෝජනා පත්‍රයක් කූඨ ලෙස සෑදීම, විරූප කිරීම, විනාශ කිරීම, කූඨ ලෙස පිලියෙල කල බව දනිමින්ම එය තේරීම්භාර නිලධාරියාට බාර දීම.

2 - ඡන්ද පත්‍රිකාවක් හෝ එහි දැක්වෙන නිල ලකුණක් විරූප කිරීම, විනාශ කිරීම, වංචනික ලෙස සෑදීම හෝ අනුකරණය කිරීම.

3 - බලය නැතිව ඡන්ද පත්‍රිකාවක් වෙනත් අයෙකුට ලබා දීම.

4 - ඡන්ද පත්‍රිකාවක් විකිණීම, විකිණීමට උත්සාහ කිරීම, මිලදී ගැනීම හෝ මිලදී ගැනීමට උත්සාහ කිරීම.

5 - නිල ලකුණ යෙදූ ඡන්ද පත්‍රිකාවක් බලය නැතිව ලඟ තබා ගැනීම.

6 - ඡන්ද පත්‍රිකාව ඡන්ද පොල තුළදී ඕනකමින්ම අන් අයට පෙන්වීම.

7 - ඡන්ද පත්‍රිකාව හැර වෙනත් යමක් ඡන්ද පෙට්ටියට දැමීම.

8 - ඡන්ද පත්‍රිකාවක් අවසර නැතිව ඡන්ද පොලෙන් පිටට ගෙන ඒම හෝ පිටතදී ලඟ තබාගෙන සිටීම.

9 - ඡන්ද පෙට්ටියක් හෝ ඡන්ද පත්‍රිකා පැකට්ටුවක් අවසර නැතිව විනාශ කිරීම, විවෘත කිරීම හෝ ඊට වෙනත් යමක් කිරීම.

10 - ඡන්ද පත්‍රිකාවක් හෝ එලෙස භාවිතා කල හැකි යමක් මුද්‍රණය කිරීම.

11 - ඡන්ද පෙට්ටියට දැමූ ඡන්ද පත්‍රිකාවක් ඉවතට ගැනීම සඳහා යම් උපකරණයක් සෑදීම, ආනයනය කිරීම හෝ සැපයීම.

12 - තැපැල් ඡන්දදායකයෙකු තම අනන්‍යතා ප්‍රකාශයෙහි සිතාමතා අසත්‍යය ප්‍රකාශයක් කිරීම.

13 - තැපැල් ඡන්දදායකයින්ට යවන ආවරණ ලියුම් කවර, ඡන්ද පත්‍රිකා ලියුම් කවර අවසරයකින් තොරව විනාශ කිරීම හෝ විවෘත කිරීම.

14 - අවසරයක් නැතිව නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා මුද්‍රණය කිරීම.

15 - අවසරයකින් තොරව ඡන්දදායකයින් උචිත ලකුණින් සලකුණු කිරීම.

★ උචිත ලකුණ - නොමැකෙන තීන්තෙන් කල සලකුණක්

16 - ඡන්දය දීමට තමාට බලයක් නැති බව දැන දැනම හොර ඡන්ද දැමීම.

17 - ප්‍රජා අයිතිය අහෝසි කල තැනැත්තකු විසින් ඡන්දය දැමීම.

ඉහත වැරදි සඳහා දඬුවම - වසර දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බරපතල වැඩ ඇතිව හෝ නැතිව සිරදඬුවමක් සහ වැරදිකරු වූ දින සිට වසර හතක් යනතුරු ඡන්දදායකයෙකු වීම, ඡන්දය දීම, හෝ මන්ත්‍රීවරයෙකු වීම තහනම් වීම. වැරදිකරු වන විට පළාත් සභා මන්ත්‍රී වරයෙකු වන අයෙකු එදින සිට ධුරයෙන් නෙරපනු ලබයි.

## ඡන්ද දිනයේ තහනම් ක්‍රියා (68 වගන්තිය)

ඡන්ද පොල සීමාව ඇතුලත හෝ ඡන්ද පොලේ සිට කිලෝමීටර් බාගයක් ඇතුලත සිදුවන වැරදි

1 - ඡන්දය ලබා දෙන ලෙස පොදුවේ හෝ යම් නිශ්චිත ඡන්දහිමියෙකුගෙන් ඉල්ලා සිටීම.

2 - යම් පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය නොදෙන ලෙස බලපෑම් කිරීම.

4 - ඡන්දය භාවිතා නොකරන ලෙස පෙලඹවීම් කිරීම.

5 - පක්ෂ සහ කණ්ඩායම් වලට අදාල නිල ලකුණු බෙදා හැරීම සහ යම් ප්‍රචාරක පත්‍රිකා, දැන්වීම්, ඡායාරූප ආදිය ප්‍රදර්ශනය කිරීම හෝ බෙදා හැරීම.

6 - ඡන්දය දීම සඳහා ඡන්ද පොලට එන අයෙකුට හෝ ඡන්ද පොල නිලධාරීන්ට බාධාවන ලෙස ක්‍රියා කිරීම.

7 - ඡන්ද පොල ඇතුලත හෝ දොරටුව අසල ඇති යම් පොදු හෝ පුද්ගලික ස්ථානයක සිට මෙගාෆෝනයක්, ශබ්ද විකාශන යන්ත්‍රයක් හෝ එවැනි උපකරණයක් භාවිතා කිරීම.

8 - ඡන්ද පොල ඇතුලත හෝ දොරටුව අසල ඇති යම් පොදු හෝ පුද්ගලික ස්ථානයක සිට කෑ ගැසීම හෝ වෙනත් අසංවර හැසිරීමක යෙදීම.

ඉහත වැරදි සඳහා දඬුවම - ඉහත වැරදි සිදු කරන්නෙකුට හෝ තැත්කරන්නෙකුට රුපියල් සියයක දඩයක් හෝ බරපතල වැඩ ඇතිව හෝ නැතිව මාසයක සිරදඬුවමක් හෝ ඒ දඬුවම් දෙකම හෝ නියම කරයි.

## පෙරහැර පැවැත්වීම (69 වගන්තිය)

නාම යෝජනා භාර ගන්නා පලමු දින සිට ඡන්ද ප්‍රතිපල නිකුත් වී සතියක් යනතුරු මැයි පෙළපාලි, ආගමික හෝ සමාජීය කාර්යයන් සඳහා පවත්වන පෙරහැර ආදිය හැර ඡන්දය අරමුණු කොට ගත් වෙනත් කිසිඳු පෙරහරක් පැවැත්වීම, මෙහෙයවීම හෝ සහභාගි වීම වරදකි.

දඬුවම - වරද සිදු කරන්නෙකුට හෝ තැත්කරන්නෙකුට රුපියල් සියයක දඩයක් හෝ බරපතල වැඩ ඇතිව හෝ නැතිව මාසයක සිරදඬුවමක් හෝ ඒ දඬුවම් දෙකම හෝ නියම කෙරේ.

## ප්‍රසිද්ධ රැස්වීම් (70 වගන්තිය)

සියලු ප්‍රසිද්ධ රැස්වීම් ඡන්ද දිනට පැය 48 කට පෙර නැවැත්විය යුතුය. එතැන්සිට පළාත් සභා මන්ත්‍රීවරුන් පත්කරගත් බවට තේරීම්භාර නිලධාරියා නිවේදනය කර සතියක් යනතුරු කිසිම ප්‍රසිද්ධ රැස්වීමක් පැවැත්වීම වරදකි.

දඬුවම - වැරදිකරුවෙකුට හෝ තැත්කරන්නෙකුට රුපියල් දහසක දඩයක් හෝ බරපතල වැඩ ඇතිව හෝ නැතිව මාසයක සිරදඬුවමක් හෝ ඒ දඬුවම් දෙකම ලබාදීම.

## ඡන්දයට අදාල ප්‍රකාශන මුද්‍රණය (72 වගන්තිය)

ඡන්ද පෝස්ටර්, අත් පත්‍රිකා, දැන්වීම් මුද්‍රණය කිරීමේදී එහි මුහුණතෙහි මුද්‍රණකරුගේ සහ ප්‍රකාශකගේ නම් සහ ලිපිනයන් සඳහන් කල යුතුය. එසේ නොකර එවැන්නක් මුද්‍රණය කිරීම, පල කිරීම, බෙදා හැරීම, ඇලවීම සිදුකරන අපේක්ෂකයෙකු නොවන ඕනෑම තැනැත්තෙක් වැරදිකරුවකු වේ.

## ඡන්ද කාර්යාල (73 වගන්තිය)

1 - ඡන්දය පැවැත්වෙන දිස්ත්‍රික්කය සඳහා එක් එක් පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට තබා ගත හැක්කේ නිවේදිත මධ්‍ය කාර්යාල එකක් පමණි. එක් එක් ඡන්ද කොට්ඨාශය සඳහා නිවේදිත ශාඛා කාර්යාල එක බැගින්ද තබා ගත හැක. මෙම

කාර්යාල සියල්ල පවත්වා ගැනීමට අවසර ඇත්තේ නාමයෝජනා භාරදුන් දිනයේ සිට ඡන්දය පැවැත්වෙන දිනට පෙර දින දක්වා පමණි.

2 - එක් එක් අපේක්ෂකයාට තමන් වෙනුවෙන් තබා ගත හැක්කේ කාර්යාල එකක් පමණි.

ඡන්දය දිනට පෙර දින සහ ඡන්දය දින පවත්වාගෙන යා හැක්කේ දිස්ත්‍රික්කය තුල පවත්වාගෙන යන නිවේදිත මධ්‍ය කාර්යාලය සහ එක් එක් අපේක්ෂකයාට හිමි කාර්යාල පමණි.

3 - බලයලත් නියෝජිතයෙකුට, කන්ඩායම් නායකයෙකුට, අපේක්ෂකයෙකුට තමා පදිංචි ස්ථානය ඡන්ද කාර්යාලයක් ලෙස පවත්වාගෙන යා හැක. එනම් අපේක්ෂකයෙකුට තමන් පදිංචිව සිටින ස්ථානය හැර ඡන්ද කාර්යාල තබා ගත හැක්කේ එකක් පමණි.

දඬුවම - වැරදිකරුවෙකුට හෝ තැත්කරන්නෙකුට රුපියල් සියයක දඩයක් හෝ බරපතල වැඩ ඇතිව හෝ නැතිව මාසයක සිරදඬුවමක් හෝ ඒ දඬුවම් දෙකම

★ මෙහි නිවේදිත කාර්යාලය යනු එකී කාර්යාලය පිහිටුවීමට පෙර එය පිහිටි ප්‍රදේශයේ පොලීසියට සහ අදාල දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරියාට දැනුම් දී පිහිටවූ කාර්යාල වේ.

## කොඩි දැමීම, ඡායාරූප ඇලවීම සහ පත්‍රිකා බෙදීම (74 වගන්තිය)

නාමයෝජනා කාලසීමාවේ පලමු දිනෙන් ආරම්භව ඡන්ද දිනයට පසු දින දක්වා

1 - අපේක්ෂකයා යන වාහනයක හැර වෙනත් කිසිඳු පොදු හෝ පුද්ගලික ස්ථානයක කොඩි/පතාක දැමීම තහනම්ය.

2 - අපේක්ෂකයාට ආධාර දීමට රැස්වීමක් පවත්වන විට එම දිනය තුල සහ එම ස්ථානයේ පමණක් අත්පත්‍රිකා, ඡායාරූප, ලකුණු, අංක ප්‍රදර්ශනය කල හැක. ඒ හැර ජනතාව සිටින වෙනත් තැනක කිසිදු ප්‍රදර්ශකයක් භාවිතා කල නොහැක.

3 - පාරක් මත හෝ හරහා පත්‍රිකා, පෝස්ටර්, චිත්‍ර, ඡායාරූප, කොඩි, පතාක, අංක, ලකුණු ප්‍රදර්ශනය කිරීම තහනම්ය.

4 - අපේක්ෂකයා යන වාහනයේ හැර වෙනත් වාහනයක (ඇතුලත හෝ පිටත) පත්‍රිකා, පෝස්ටර්, චිත්‍ර, ඡායාරූප, අංක, ලකුණු ප්‍රදර්ශනය කිරීම තහනම්ය.

දඬුවම - වැරදිකරුවෙකුට හෝ තැත්කරන්නෙකුට රුපියල් සියයක දඩයක් හෝ බරපතල වැඩ ඇතිව හෝ නැතිව මාසයක සිරදඬුවමක් හෝ ඒ දඬුවම් දෙකම

යමෙක් ඉහත ක්‍රියාවන් සිදු කරයි නම් එය වැලැක්වීම සඳහා අවශ්‍ය යුක්ති සහගත පියවර ගැනීමට සහ බලය පාවිච්චි කිරීමට පොලිස් නිලධාරියෙකුට බලය ඇත. එමෙන්ම එම ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීමට සහ ඉවත් කිරීමටද ඔහුට බලය ඇත.

ඉහත වැරදි සිදුකරමින් පවතින විටක අපේක්ෂකයෙකුට, දේශපාලන පක්ෂයක ලේකම් වරයෙකුට හෝ සම්බන්ධතාවක් ඇති වෙනත් පාර්ශවයකට ඒ පිලිබඳව මහේස්ත්‍රාත් අධිකරණයට දන්වා ඒවා වහාම ඉවත් කරවා ගැනීම සඳහා නියෝගයක් ලබා ගත හැක.

## ඡන්දය ඉල්ලීම සඳහා නිවාසවලට යාම (75 වගන්තිය)

නාමයෝජනා කාලසීමාවේ පලමු දිනෙන් ආරම්භව ඡන්ද දිනයට පසු දින දක්වා

1 - ඡන්දය ඉල්ලීම සඳහා

2 - යම් පක්ෂයකට හෝ කණ්ඩායමකට ඡන්දය නොදෙන ලෙස ඉල්ලා සිටීම සඳහා

3 - ඡන්දය නොදා සිටින ලෙස ඉල්ලා සිටීම සඳහා

4 - යම් ප්‍රචාරක පත්‍රිකාවක්, අංකයක්, සලකුණක්, ඡායාරූපයක් ප්‍රදර්ශනය කිරීම සඳහා අපේක්ෂකයා හෝ ඔහුගේ පවුලේ සාමාජිකයෙකු විසින් නිවෙස් වලට යාම තහනම් වේ.

දඬුවම - රුපියල් සියයක දඩයක් හෝ බරපතල වැඩ ඇතිව හෝ නැතිව මාසයක සිරදඬුවමක් හෝ ඒ දඬුවම් දෙකම

## ප්‍රජා අයිතිය අහෝසි වූ තැනැත්තන් (76 වගන්තිය)

ප්‍රජා අයිතිය අහෝසි වූ අයෙකුට කිසිඳු අපේක්ෂකයෙකු වෙනුවෙන් ඡන්දය ඉල්ලා සිටීම, නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම, ඔහු වෙනුවෙන් කතා කිරීම හෝ එවැනි වෙනත් යමක් කිරීමද කල නොහැක. එමෙන්ම ප්‍රජා අයිතිය අහෝසි වූ බව දනිමින් එවන් තැනැත්තෙක් තම ප්‍රචාරණය සඳහා උපයෝගී කරගන්නා අපේක්ෂකයෙක්ද වරදක් සිදු කරයි.

## ඡන්දයේ රහස්‍යභාවය රැක ගැනීම (77 වගන්තිය)

ඡන්ද පොල තුල සහ ඡන්ද ගණන් කරන තැන සිටින බලයලත් තැනැත්තන් (අපේක්ෂකයන්, නියෝජිතයන්, ලිපිකරුවන්, ස්ථානාධිපති, තේරීම්භාර නිලධාරීන් ආදී) පලමු උපලේඛනයේ 'ක' ආකෘතියට අනුව ව්‍යවස්ථාපිත රහස්‍යතා ප්‍රකාශයක් කල යුතුය. ඒ අනුව එම සෑම තැනැත්තෙක්ම ඡන්දය දීම පිලිබඳ රහස්‍යභාවය රැකිය යුතු අතර නීතියෙන් බලය නොලද කිසිඳු හෙලිදරව් කිරීමක් කිසිඳු අයෙකුට නොකල යුතුය.

- ★ ඡන්ද හිමි නාම ලේඛනයේ සඳහන් නම්, අංක, නිල ලකුණු අනාවරණය නොකල යුතුය.
- ★ යමෙකු ඡන්දය දීමට යන පක්ෂය හෝ කණ්ඩායම කවරක්ද යන්න දැන ගැනීමට තැත් කිරීම හෝ දැනගත් විටක එය එලිදරව් කිරීම වරදකි.
- ★ ඡන්ද පත්‍රිකාවේ පිටපැත්තේ ඇති අංකය දැනගැනීමට තැත්කිරීම හෝ දැනගත් විටක එය වෙනත් තැනැත්තකුට අනාවරණය කිරීම වරදකි.
- ★ ඡන්ද ගණන් කිරීමේදි ඡන්ද පත්‍රිකාවේ පිටපැත්තේ ඇති අංකය දැනගැනීමට තැත් කිරීම සහ ඒ මගින් දැනගත් තොරතුරු වෙනත් අයට හෙලිදරව් කිරීම වරදකි.
- ★ ඡන්ද පත්‍රිකාවක් ලැබුණු තැන් සිට ඡන්ද පෙට්ටියට එය ඇතුල් කිරීමට පෙර ඡන්දදායකයා සමග කතා කිරීම වරදකි.
- ★ (ඡන්ද ස්ථානාධිපති හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුගේ නීත්‍යානුල ක්‍රියාවක් මීට අදාල නොවේ)

දඬුවම - රුපියල් පන්සියයක දඩයක් හෝ බරපතල වැඩ ඇතිව හෝ නැතිව මාස හයක සිරදඬුවමක් සහ වරදකරු කල දින සිට වසර හතක් යනතුරු ඡන්දහිමියෙකු ලෙස ලියාපදිංචිකිරීම හෝ ඡන්දය දීම තහනම් වීම.

## දූෂණ ක්‍රියා

## හොර ඡන්ද දැමීම (78 වගන්තිය)

1 - තමාගේ නමින් එක් වතාවකට වඩා ඡන්දය දැමීම.

2 - ජීවත්ව සිටින හෝ නොසිටින වෙනත් තැනැත්තකු වෙනුවෙන් පුද්ගලිකව හෝ තැපැල් මගින් ඡන්දය ලබා දීම.

ඉහත කාරණා සඳහා පුද්ගලික හෝ තැපැල් ඡන්ද පත්‍රිකාවක් සඳහා ඉල්ලුම් කිරීම/තැපැල් ඡන්ද පත්‍රිකාවක් වලංගු හෝ අවලංගු ආකාරයට සලකුණු කර තිබීම යන කරුණුද හොර ඡන්දයක් දැමූ අයෙකු ලෙස සැලකීමට හේතු වේ. මේ ක්‍රියාව සඳහා ආධාර අනුබල දෙන තැනැත්තෙක්ද දූෂණ ක්‍රියාවකට වරදකරුවෙක් වේ.

දඬුවම - බරපතල වැඩ ඇතිව වසරක සිරදඬුවමක්

## සංග්‍රහ කිරීම (79 වගන්තිය)

ඡන්දයට පෙර, ඡන්දය දින හෝ ඡන්දයට පසු තමන්ම හෝ වෙනත් අයෙකු මාර්ගයෙන්

1 - ඡන්දය දීම හෝ නොදී සිටීම සඳහා

2 - ඡන්දය දී තිබීම හෝ නොදී තිබීම , ඡන්දය නොදීමට සූදානම්ව සිටීම

යන කරුණු සඳහා සෘජුව හෝ වක්‍රව යම් ඡන්ද හිමියෙකුට ප්‍රතිලාභයක් ලබා දීම හෝ ලබා දීමට පොරොන්දු වන තැනැත්තකු සංග්‍රහ කිරීමේ වරද සිදු කරයි. එමෙන්ම එවැනි ප්‍රතිලාභයක් ලබාගන්නා ඡන්ද හිමියෙකුද සංග්‍රහ කිරීමේ වරදට වරදකරුවකු වේ.

දඬුවම - රුපියල් පන්සියයක දඩයක් හෝ බරපතල වැඩ ඇතිව හෝ නැතිව මාස හයක සිරදඬුවමක් හෝ ඒ දඬුවම් දෙකම.

## අයුතු බලපෑම (80 වගන්තිය)

ඡන්දය දීමට, ඡන්දය නොදීමට, එසේත් නැත්නම් ඡන්දහිමියෙකුගේ ඡන්ද බලය නිදහසේ භාවිතා කිරීමට බාධා පමුණුවන ආකාරයේ ඕනෑම පෙලඹවීමක්, බල කිරීමක්, සාහසික ක්‍රියාවක්, පැහැරගෙන යාමක්, තර්ජනයක්, වංචනික ක්‍රියාවක්, අධ්‍යාත්මික හෝ ලෞකික හානියක්, පාඩුවක්, අලාභයක් කරන හෝ එසේ කරන බවට තර්ජනය කරන අයෙකු කරන්නේ අයුතු බලපෑමේ වරදයි.

නාමයෝජනා කාලසීමාවේ පළමු දින සිට ඡන්දයෙන් පසු දින දක්වා ඊට අදාල වන පහත කරුණුද තහනම් වේ.

1 - ආගමික රැස්වීමකදී ඡන්ද ප්‍රතිඵලයට බලපෑමක් කිරීමට හෝ දේශපාලන පක්ෂයකට/කණ්ඩායමකට ඡන්දය දීම හෝ නොදීමට පෙලඹවීම සඳහා වූ වචන පැවසීම.

2 - ආගමික රැස්වීමකදී ඉහත කාර්යය සඳහා පත්‍රිකා, අපේක්ෂකයෙකුගේ ඡායාරූපයක්, ලකුණක් ආදිය බෙදාහැරීම හෝ ප්‍රදර්ශනය කිරීම.

3 - ආගමික ස්ථානයකදී ඡන්ද ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා මහජන රැස්වීමක් පැවැත්වීම.

4 - ආගමික සංස්ථාවක සාමාජිකයකු/නිලධාරියෙකු විසින් එකී ආගමට අයත් යම් ඡන්දහිමියෙකු ඡන්දය භාවිතා කල හෝ නොකල ආකාරය මත, ඡන්දයේදී ආධාර අනුබල දුන් ආකාරය මත, එසේත් නැත්නම් එවැනි කාර්යයක් සඳහා පෙලඹවීම සඳහා,

⋆ එකී අනුගාමිකයාට හෝ සාමාජිකයාට සපයන යම් ආගමික සේවාවක් හෝ ප්‍රතිලාබයක් ලබා දීම ප්‍රතික්ෂේප කිරීම හෝ එසේ කරන බවට තර්ජනය කිරීම.

⋆ එකී අනුගාමිකයා එය ආගමික සංස්ථාපිතයෙන් නෙරපන බවට තර්ජනය කිරීම.

5 - යම් සේවායෝජකයෙකු විසින් එම රැකියාවේ යෙදෙන යම් ඡන්දහිමියෙකු ඡන්දය භාවිතා කල හෝ නොකල ආකාරය මත, ඡන්දයේදී ආධාර අනුබල දුන් ආකාරය මත, එසේත් නැත්නම් එවැනි කාර්යයක් සඳහා පෙලඹවීම සඳහා,

★ රැකියාවෙන් ඉවත් කිරීම හෝ එසේ කරන බවට තර්ජනය කිරීම.

★ එතෙක් භුක්ති විඳිමින් සිට ඉදිරියට හිමිවන්නට තිබූ ප්‍රතිලාභ නොදීම හෝ නොදෙන බවට තර්ජනය කිරීම.

දඬුවම - රුපියල් පන්සියයක දඩයක් හෝ බරපතල වැඩ ඇතිව හෝ නැතිව මාස හයක සිරදඬුවමක් හෝ ඒ දඬුවම් දෙකම

## අල්ලස් (81 වගන්තිය)

1 - ඉදිරියේදී ඡන්දය දීමට, නොදීමට, එසේත් නැත්නම් දැනටමත් ඡන්දය භාවිතා කිරීම හෝ නොකිරීම වෙනුවෙන් සෘජුව හෝ වක්‍රව තමන්ම හෝ වෙනත් අයෙකු මාර්ගයෙන්,

යම් මුදලක් / ණයක් / තනතුරක් / නිලයක් / තෑග්ගක් / රැකියාවක්/එකඟවීමක් හෝ යෝජනාවක් ලබා දීම, දීමට පොරොන්දු වීම හෝ දීමට උත්සාහ කිරීම අල්ලස් ලබා දීමේ වරද වේ. එමෙන්ම ඉහත කී අරමුණු උදෙසා ඡන්දහිමියෙකු විසින් එවන් ප්‍රතිලාභ ලබාගැනීම හෝ ඉල්ලාසිටීම අල්ලස් ගැනීමේ වරද වේ.

2 - නාම යෝජනා ලැබීමට, අපෙක්ෂකයෙකු වීමෙන් වැලකී සිටීමට, අපේක්ෂකයකු වී සිටී නම් ඉල්ලා අස්වීම සඳහා පෙලඹවීමට සෘජුව හෝ වක්‍රව තමන්ම හෝ වෙනත් අයෙකු මාර්ගයෙන්,

යම් මුදලක් / ණයක් / තනතුරක් / නිලයක් / තෑග්ගක් / රැකියාවක්/එකඟවීමක් හෝ යෝජනාවක් ලබා දීම, දීමට පොරොන්දු වීම හෝ දීමට උත්සාහ කිරීම අල්ලස් ලබා දීමේ වරද වේ.

දඬුවම - රුපියල් පන්සියයක දඩයක් හෝ බරපතල වැඩ ඇතිව හෝ නැතිව මාස හයක සිරදඬුවමක් හෝ ඒ දඬුවම් දෙකම

## තවත් දූෂණ ක්‍රියා

★ යම් අපේක්ෂකයෙක්ගේ චරිතය හෝ හැසිරීම ගැන ඡන්දයට පෙර හෝ ඡන්දය පවත්වන අතරතුර ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් කල හැකි ආකාරයේ අසත්‍ය ප්‍රකාශයක් කිරීම.

★ ඡන්දයට පෙර හෝ ඡන්දය පවත්වන අතරතුර ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් කල හැකි ආකාරයෙන් යම් අපේක්ෂකයෙක් ඡන්ද විමසීමෙන් ඉල්ලා අස්වූ බවට අසත්‍ය ප්‍රකාශයක් කිරීම.

දඬුවම - රුපියල් පන්සියයක දඩයක් හෝ බරපතල වැඩ ඇතිව හෝ නැතිව මාස හයක සිරදඬුවමක් හෝ ඒ දඬුවම් දෙකම

★ දූෂණ ක්‍රියා (78/79/80/81 වගන්ති) සඳහා වරදකරුවකු වූවකුට ඡන්ද අයිතිවාසිකම වසර හතකට තහනම් කෙරේ. වරදකරු වන විට මන්ත්‍රීවරයෙකු නම් එදින සිට හෙතෙම ධූරයෙන් නෙරපනු ලබයි.

## නීති විරෝධී ක්‍රියා

## නීති විරෝධී ප්‍රවාහනය (84 වගන්තිය)

1 - ඡන්ද පොල වෙතට හෝ ඡන්ද පොලේ සිට ඡන්දහිමියන් වාහන හෝ සතුන් මගින් ප්‍රවාහනය කිරීම සඳහා ගෙවීම් කිරීම සහ ඒ සඳහා ගිවිසුමක් ඇති කරගැනීම නීති විරෝධී වේ.

2 - ඡන්දය පැවැත්වෙන දින පෙ.ව 6.00 සිට එදින ප.ව 5.00 දක්වා කාල සීමාව තුල ඡන්දහිමියන් ප්‍රවාහනයට වාහන, ජලයාත්‍රා ආදිය කුලියට ගැනිම, සේවයෙහි යෙදවීම හෝ ඒ සඳහා ආධාර දීම නීති විරෝධී ක්‍රියාවකි.

දඬුවම - අදාල වාහනය, යාත්‍රාව රාජසන්තක කිරීම

## ප්‍රවාහනය නීති විරෝධී නොවන අවස්ථා

★ නීත්‍යානුකූල හෝ නිල කාර්යයක් ලෙස එකී ප්‍රවාහනය කල යුතුනම්

★ තමන් පදිංචි ස්ථානයේ සිට ඡන්ද පොලට යාමට ගඟක් හෝ මුහුදක් හරහා යාම අනිවාර්යයක් නම්

★ ශාරීරික දුබලතාවය නිසා පයින් හෝ මහජන ප්‍රවාහන සේවාවක් මගින් ඡන්ද පොල වෙත යා නොහැකි තැනැත්තෙක් නම්

(මෙහිදී ඔහු වෙනුවෙන් වෙනත් අයෙක් ඡන්දයට දින හතකට පෙර අදාල දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරීයා වෙත ලිඛිත ඉල්ලීමක් කර ලිඛිත අවසරයක් ගත යුතුය)

යම් පොලිස් නිලධාරියෙකුට තමන් විසින්ම හෝ වෙනත් අයෙකුගේ පැමිණිල්ලක් මත විමර්ශනයකින් පසු නීති විරෝධී ප්‍රවාහනය සඳහා යොදා ගන්නා වාහන හෝ යාත්‍රා තහනමට ගෙන ඡන්දය අවසන් වනතුරු පොලිසිය තුල රඳවා ගැනීමට බලය ඇත.

## ප්‍රදර්ශනය සඳහා නීති විරෝධී ගෙවීම් කිරීම (84 වගන්තිය)

යම් පත්‍රිකාවක්, දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා හෝ ඒ සඳහා යොදාගන්නා ගෙයක්/ඉඩමක්/ගොඩනැගිල්ලක් සඳහා ගෙවීමක් කිරීමද එවැන්නක් සඳහා ගිවිසුමක් ඇති කරගැනීමද නීති විරෝධී වේ.

★ ඉහත අවස්ථා වලදී සිතාමතාම එවැනි ගෙවීමක් කරන්නා මෙන්ම ගෙවීම ලබන්නාද වරදකරුවකු වේ.

නමුත් දැන්වීම් ප්‍රදර්ශනය තම සාමාන්‍ය වෘත්තිය වන අයෙක් වෙත කරන ගෙවීමක් නීති විරෝධී නැත. නමුත් එකී ගණුදෙණුව සාමාන්‍ය ව්‍යාපාරික කටයුත්තක් ලෙස සිදු වී තිබිය යුතුය.

## අසත්‍ය පුවත්පත් වාර්තා (85 වගන්තිය)

1 - පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක කටයුතු පිලිබඳව හෝ යම් අපේක්ෂකයෙක්ගේ කතා සහ කටයුතු පිලිබඳ හෝ අසත්‍ය ප්‍රකාශයක් පල කල පුවත්පතක/සඟරාවක/පත්‍රිකාවක කතුවරයා, අයිතිකරු, සංස්කාරක, ප්‍රකාශක හෝ වෙනත් එවන් නිලධාරියෙක් නීති විරෝධී ක්‍රියාවකට වරදකරුවකු වේ.

## නීති විරෝධී ලෙස සේවයේ යෙදවීම (86 වගන්තිය)

ඡන්ද පොල නියෝජිතයින්, ගණන් කිරීමේ නියෝජිතයින්, ලිපිකරුවන් හැර වෙනත් කිසිඳු තැනැත්තෙක් ඡන්ද විමසීමට ආධාර වීමේ කාර්යය සඳහා වැටුපකට, ගෙවීමකට හෝ ගෙවන බවට වූ පොරොන්දුවක් පිට ඡන්දයට පෙර, ඡන්දය දින හෝ ඡන්දයෙන් පසු සේවයේ යෙදවීම නීති විරෝධී ක්‍රියාවක් වෙයි.

## නීති විරෝධී ප්‍රකාශන මුද්‍රණය (87 වගන්තිය)

මුද්‍රණකරුගේ සහ ප්‍රකාශකගේ නම/ලිපිනය ඉදිරිපස සඳහන් නොකල ඡන්දයට අදාල ප්‍රකාශන මුද්‍රණය කරන, පල කරන, බෙදා හරින හෝ එසේ කිරීමට සලස්වන අපේක්ෂකයෙක් හෝ ඔහුගේ නියෝජිතයෙක් නීති විරෝධී ක්‍රියාවකට වරදකරුවකු වේ.

ඉහත සියළු නීති විරෝධී ක්‍රියාවන්ට දඬුවම් - රුපියල් තුන්සියයක දඩයක් සහ වසර තුනකට ඡන්දය දීමේ අවස්ථාව අහිමි වේ. වරද සිදු කරන විට යමෙක් පළාත් සභා මන්ත්‍රීවරයෙකු නම් වරදකරු වූ දින සිට ධුරයෙන් නෙරපනු ලබයි.

66 වගන්තියේ සිට 89 වගන්තිය දක්වා අතිරේක දඬුවම

වරදකරු කල දින සිට වසර පහකට පළාත් සභාවකට තේරී පත්වීමට අවස්ථාව අහිමි වේ.

## ඡන්ද විමසීම

## ඡන්දය පිලිබඳ දැන්වීම් (22 වගන්තිය)

ඡන්දය පවත්වන දිස්ත්‍රික්ක, සිංහල අකාරාදි පිලිවෙලට සෑදූ දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්, අපේක්ෂකයින්ට හිමි අංක, ඡන්දය පවත්වන දිනය, ඡන්ද පොල තොරතුරු තේරීම්භාර නිලධරයා විසින් ගැසට් කරනු ලැබේ.

## ඡන්දය පවත්වන දිනය (22 වගන්තිය)

දැන්වීම් පලකල දින සිට සති පහකට නොඅඩු සහ සති අටකට වැඩිනොවූ සෙනසුරාදාවක් හෝ වෙනත් දිනයක් (පෝය දින සහ රජයේ නිවාඩු දින අතහැර) යොදාගනී. එදින පෙ.ව 7.00 සිට ප.ව 4.00 දක්වා ඡන්ද විමසීම පැවැත්වේ. එම දිනයෙහි යම් හදිසි තත්ත්වයක් මත ඡන්දය පැවැත්විය නොහැකි වුවහොත් ඒ සඳහා වෙනත් දිනයක් ගැසට් කරන අතර එම දිනය එම ගැසට් දැන්වීමේ සිට දවස් දාහතරක් ඇතුලත විය යුතුය.

## ඡන්ද පොල (22 වගන්තිය)

විශේෂම අවස්ථාවල හැර සියලු ඡන්ද පොල ඡන්ද කොට්ඨාශය තුල පිහිටිය යුතුය. එම පිහිටීම එකී ඡන්ද කොට්ඨාශය තුල පදිංචිව සිටින ඡන්දදායකයන්ට ඇතිවන අපහසුව ඉතාම අඩු වන ආකාරයට තිබිය යුතුය. ඡන්ද පොල තුල සිටිය හැකි තැනැත්තන්

1 - ඡන්දය දීමට පැමිණි ඡන්දදායකයින්

2 - ඡන්ද පොල රාජකාරීන්හි නිරත නිලධාරීන්/සේවකයින්

3 - රාජකාරියෙහි නිරත පොලිස් නිලධාරීන්

4 - දේශපාලන පක්ෂ ලේකම්වරුන්/අපේක්ෂකයින්

★ එක් අවස්ථාවක එක් අපේක්ෂකයෙක්ට වඩා ඡන්ද පොල තුල රැඳී සිටීමට අවසර නැත.

## තැපැල් ඡන්දය (24 වගන්තිය)

පුද්ගලිකව තමන්ට හිමි ඡන්ද පොලේ දී ඡන්දය භාවිතා කිරීමට අවස්ථාවක් නොමැති තැනැත්තන්ට මේ සඳහා අවස්ථාව ඇත. ඒ සඳහා තැපැල් ඡන්ද ඉල්ලුම්පත් නාමයෝජනා දැන්වීම් පල කල දින සිට දින 10ක් ඇතුලත ඉදිරිපත් කල යුතුය. එම ඉල්ලීම සලකා බලා තේරීම් භාර නිලධාරියා විසින් ඔහුගේ තීරණය අදාල ඉල්ලුම්කරුට ලිඛිතව දන්වා සිටී. එම තීරණය අවසානාත්මක වේ. එනිසා ඊට එරෙහිව අභියාචනය කල නොහැක.

එසේ තේරීම්භාර නිලධාරියා විසින් තැපැල් ඡන්ද හිමියන්ගේ ලයිස්තුවක් පිලියෙළ කර එහි පිටපතක් තම කාර්යාලයේ ප්‍රදර්ශනය කල යුතුය.

තැපැල් ඡන්ද හිමි වූ තැනැත්තන්ට පුද්ගලිකව ඡන්දපොළට ගොස් ඡන්දය භාවිතා කල නොහැක. එම විධි විධානය කඩකරන තැපැල් ඡන්ද හිමියෙකු රුපියල් පන්සියයක දඩයකට, වසරක බරපතල වැඩ ඇතුව හෝ නැතුව සිරගත කිරීමකට හෝ ඒ දෙකටම යටත් වේ.

## තැපැල් ඡන්දය අයදුම් කල හැකි තැනැත්තන් (24 වගන්තිය)

1 - රැකියාවේ ස්වාභාවය සහ විශේෂම අවස්ථානුගත කරුණු හේතුකොට යුධ, නාවික, ගුවන් හමුදා සාමාජිකයින් / පොලිස් නිලධාරීන් / දුම්රිය,තැපැල්,විදුලි සංදේශ දෙපාර්තමේන්තු නිලධාරීන් / මධ්‍යම හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල සාමාජිකයන්

2 - මැතිවරණ රාජකාරීන්හි යෙදී සිටිම හෝ යෙදවීමට ඉඩක් තිබීම හේතුකොට රජයේ සේවයේ, මහ බැංකුවේ හෝ පළාත් පාලන සේවයේ නිරතවන්නන්

3 - පදිංචි දිස්ත්‍රික්කය නොවන දිස්ත්‍රික්කයකින් ඡන්දයට ඉදිරිපත්වන අපේක්ෂකයින්

## තැපැල් ඡන්ද හිමියන් වෙත යවන ලේඛන (24 වගන්තිය)

1 - ඡන්ද පත්‍රිකාව සහ එය ලකුණු කොට එවීම සඳහා ඡන්ද පත්‍රිකා අංකය සහිත ලියුම් කවරය

2 - අනන්‍යතා ප්‍රකාශයේ ආකෘතියක්

3 - ඉහත 1 සහ 2 ලේඛන බහා යැවීම සඳහා ලොකු ලියුම් කවරයක්

## නිල ඡන්ද දැන්වීම් (poll card) (25 වගන්තිය)

තේරීම්භාර නිලධාරියා විසින් සෑම ඡන්ද හිමියෙක් වෙතම (තැපැල් ඡන්ද හිමියන් හැර) නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් යැවිය යුතුය.

එහි,

1 ඡන්ද හිමියාගේ නම/ලිපිනය/ලියාපදිංචිකල අංකය

2 පරිපාලන දිස්ත්‍රික්කය/ඡන්ද ප්‍රදේශය/ඡන්දකොට්ඨාශය/නියමිත ඡන්ද පොල

3 ඡන්දය පැවැත්වෙන දිනය සහ වෙලාව සඳහන්ව තිබිය යුතුය.

මෙම නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව අඩුම වශයෙන් ඡන්ද දිනට දින හතකට පෙර සාමාන්‍ය තැපෑලෙන් යැවිය යුතු අතර එසේ ලබා දීමට තැපැල් කාර්යාලයට නොහැකි වන පත්‍රිකා ඡන්ද හිමියා විසින් ඉල්ලූ විට

ලබාදීම සඳහා ඡන්දය දින ප.ව 4.00 වනතුරු තැපැල් කාර්යාලයේම තබා ගත යුතුය. තම නම ඡන්දහිමි නාමලේඛනයේ ඇතත් නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාව නොලැබුණු විටක ඡන්ද හිමියෙකුට කල හැකි පළමු කාර්යය වන්නේ තැපැල් කාර්යාලයේ එය තිබේදැයි පරීක්ෂා කිරීමය.

බලයක් නැතිව නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා වෙනත් අයෙකුට දීම, විකිණීම හෝ ඒ සඳහා උත්සාහ කිරීම, මිලට ගැනීම හෝ මිලදී ගැනීමට උත්සාහ කිරීම දඩයක් සහ බරපතල වැඩ ඇතිව හෝ නැතිව මාස හයක් බන්ධනාගාර ගත කල හැකි වරදකි.

වෙනත් අයෙකුගේ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් ළඟ තබා ගැනීමද වරදක් වන අතර ඊට දඬුවම වනුයේ බරපතල වැඩ ඇතිව හෝ නැතිව මාස හයක් බන්ධනාගාර ගත කිරීමයි.

## ඡන්ද පත්‍රිකා ballot paper (30 වගන්තිය)

1 - පිළිගත් දේශපාලන පක්ෂවල නම් සිංහල අකාරාදී අනුපිළිවෙලට සකසා ඒ ඉදිරියෙන් ඒ ඒ පක්ෂ වලට අදාල ලකුණු ද භාෂා තුනෙන්ම දැක්විය යුතුය.

2 - ඊට පසු එක් එක් ස්වාධීන කන්ඩායම් සහ ඒවාට හිමි අංක සහ ඡන්ද ලකුණු ඇත්නම් ඒවා භාෂා තුනෙන් අනුපිළිවෙලට දැක්විය යුතුය.

★ ඡන්දය ලකුණු කිරීමට ඉඩ ඒ ඉදිරියෙන් තබා තිබිය යුතුය.

3 - පළාත් සභාවට තෝරා ගන්නා මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාවට තවත් තුනක් එකතු කල විට ලැබෙන සංඛ්‍යාව අනුක්‍රමික අංක වශයෙන් මුද්‍රණය කල යුතුය.

4 - සෑම ඡන්ද පත්‍රිකාවකම පිට පැත්තේ සහ උප පත්‍රිකාවේ එකම අනුක්‍රමික අංකයක් මද්‍රණය කර තිබිය යුතුය.

5 - ඡන්ද පත්‍රිකාව නැමිය හැකි විය යුතුය.

## ඡන්ද පොල තුල පහසුකම් (27/28 වගන්ති)

අදාල තේරීම් භාර නිලධාරියා විසින්,

1 - ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති, අතිරේක ස්ථානාධිපතිවරුන්, අවශ්‍ය තරම් ලිපිකරුවන් සහ අනිකුත් කාර්ය මන්ඩලය

2 - ඡන්දය දැමීම සඳහා රහස්‍යභාවය හොඳින් සුරැකෙන වට කල ස්ථානයක්

3 - ඡන්ද හිමි නාම ලේඛන පිටපත් / තැපැල් ඡන්ද හිමියන්ගේ ලයිස්තුවක්

4 - අවශ්‍ය තරම් ඡන්ද පෙට්ටි/ඡන්ද පත්‍රිකා/ඡන්දය ලකුණු කිරීමට අවශ්‍ය පැන්සල් ආදිය

5 - ඡන්දදායකයින්ට මඟපෙන්වීම සඳහා පනතේ 3 ආකෘතියට අනුව සෑදූ උපදෙස් දැන්වීම්

6 - ඡන්දයට ඉදිරිපත් වන පක්ෂ/ස්වාධීන කණ්ඩායම් සහ ඒවාට හිමි නිල ලකුණු, අපේක්ෂක නම් සහ අංක සඳහන් දැන්වීම්

(මේ සියලු දැන්වීම් භාෂා තුනෙන්ම තිබිය යුතුය)

## ඡන්දපොළ නියෝජිතයින් (32 වගන්තිය)

ඡන්ද විමසීම නිසිපරිදි සිදු වන්නේදැයි නිරීක්ෂණය කිරීමට ඡන්ද පොල නියෝජිතයින් පත් කෙරේ. මෙම පත්කිරීම සිදුකරන්නේ එක් එක් පක්ෂයේ ලේකම් වරයා, ඔහුගේ බලයලත් නියෝජිතයා, හෝ ස්වාධීන කන්ඩායම් නායකයා විසිනි.

ඒ සෑම පත් කිරීමක්ම ලිඛිතව සිදුවිය යුතු අතර එහි පත්කල තැනැත්තාගේ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සටහන් කර තිබිය යුතුය. එම ලේඛනය ඡන්ද දිනට පෙර හෝ ඡන්ද දිනය තුල ඡන්ද ස්ථානාධිපතිවරයාට ලබා දිය හැක. ඊට පෙර එම ලියවිල්ල පක්ෂයක නම් ලේකම්වරයා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා, කණ්ඩායමක නම් එහි නායකයා අත්සන් කර තිබිය යුතුය.

නමුත් ඒ අය විසින් බලය දුන් අපේක්ෂකයෙක්ටද මෙම පත්කිරීම කල හැක. එය තේරීම්භාර නිලධාරියා වෙත ලිඛිතව කල යුතුය. නමුත් එම බලය පැවරීම එක් ඡන්ද ප්‍රදේශයකට එක් අපේක්ෂකයෙක්ට සීමා විය යුතුය.

පත්කල නියෝජිතයෙකු අවලංගු කර වෙනත් නියෝජිතයෙකු ඒ වෙනුවෙන් පත් කරයි නම් පෙර පරිදිම ඔහු පිලිබඳ සියලු තොරතුරු ඡන්ද ස්ථානාධිපතිට ලිඛිතව දැන්විය යුතුය.

එක් පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින් එක් ඡන්ද පොලක් තුල රැඳී සිටිය හැකි උපරිම නියෝජිතයින් ගණන 2 ක් පමණි.

## ඡන්දය විධිමත් කිරීම සඳහා තවත් කරුණු (33 වගන්තිය)

1 - ඡන්දය දීම සඳහා නියමිත ඡන්ද පොලට හැර වෙනත් ඡන්ද පොලකට ඡන්දහිමියෙකු ඇතුලත් කර නොගත යුතුය.

2 - ඡන්ද පොලෙහි මනා පැවැත්ම රැකගැනීමට සහ ඡන්ද පොල තුල රැඳීසිටීමට අයිතිය ඇති අය හැර අන් සියලු දෙනා ඉවත් කිරීමට ඡන්දපොළ ස්ථානාධිපතිවරයා කටයුතු කල යුතුය.

3 - ඡන්දපොළ තුල නොමනා අන්දමින් හැසිරීම හෝ ස්ථානාධිපතිගේ නියෝග නොසලකා හැරීම සිදුකරන්නෙකු පොලීසිය මගින් හෝ තමන් විසින් බලය දෙනු ලැබූ වෙනත් අයෙකු මාර්ගයෙන් වහාම ඉවත් කිරීමට ඔහුට බලය ඇත.

★ එසේ ඉවත් කල අයෙක්ට ස්ථානාධිපතිවරයා අවසර දුන්හොත් මිස ඡන්ද විමසීම අවසන් වනතුරු ඡන්ද පොලට ඇතුල්විය නොහැක.

එමෙන්ම එම තැනැත්තා වරදකට චෝදනා ලැබ ඇත්නම් මහේස්ත්‍රාත්වරයා ඉදිරියට පමුනුවන තෙක් අත්අඩංගුවේ තබා ගත හැක.

කෙසේ නමුත් ඉහත පරිදි ක්‍රියා කරද්දී ඔහුගේ ඡන්ද අයිතිය කඩ නොවන ලෙස කටයුතු කල යුතුය.

## ඡන්ද විමසීම ආරම්භ කිරීම (34/35 වගන්ති)

ඡන්දය පැවැත්වෙන දින පෙ.ව 7.00 ට පෙර එදින භාවිතා කිරීමට නියමිත ඡන්ද පත්‍රිකා, නිල මුද්‍රාව, නිල ලකුණ, ඡන්දහිමි නාම ලේඛනයේ පිටපත්, ස්ථානාධිපතිවරයා විසින් ඡන්ද පොලට පැමින සිටින තැනැත්තන්ට පෙන්විය යුතුය.

එක් එක් ඡන්ද පෙට්ටිය ඔවුන් ඉදිරියේ විවෘත කර එය හිස්ව තිබෙන බව තහවුරු කර ගත් පසු එයට යතුරු දමා මුද්‍රා තැබිය යුතුය.

ඡන්ද පෙට්ටිය ස්ථානගත කිරීමේදී එය තමාට හොඳින් පෙනෙන තැනක තැබීමට ස්ථානාධිපතිවරයා කටයුතු කල යුතුය.

ඡන්ද විමසීම ආරම්භ වූ විට එක් එක් ඡන්දහිමියාට එක් ඡන්ද පත්‍රිකාවක් බැගින් දෙනු ලබයි.

ඊට පෙර,

1 - ඡන්ද නාම ලේඛනයේ දැක්වෙන පරිදි ඡන්ද හිමියාගේ නම/අංකය/විස්තරය හඬ නගා කියවයි.
2 - ඡන්දහිමියාගේ අංකය උප පත්‍රිකාවේ ලකුණු කර ඡන්ද පත්‍රිකාව එයින් වෙන් කරයි.
3 - ඡන්ද පත්‍රිකාවේ නිල ලකුණ තැබීම/තෙරපීම හෝ සිදුරු කිරීම කල යුතුය.
4 - ඡන්ද පත්‍රිකාව ලබා දීමෙන් පසු ඒ අයගේ නම ඉදිරියේ එසේ දුන් බව හඳුනා ගැනීමට ලකුණක් තැබිය යුතුය.
5 - ඉන්පසු ඡන්ද හිමියාව උචිත සලකුණින් (නොමැකිය හැකි තීන්තෙන් කල සලකුණක්) පහත පරිදි සලකුණු කල යුතුය.

★ මෙහිදී වම් අතේ සුලැඟිල්ල, සුලැඟිල්ල නැත්නම් එම අතේම වෙනත් ඇඟිල්ලක්

★ වම් අතේ ඇඟිලි සියල්ල නැත්නම් දකුනතේ සුලැඟිල්ල, එම සුලැඟිල්ලද නැත්නම් දකුනතේ වෙනත් ඇඟිල්ලක්

★ වම් සහ දකුණු අත් දෙකෙහිම ඇඟිලි නොමැති නම් එම අත්වල කෙලවර

## ඡන්ද පත්‍රිකා නිකුත් නොකරන්නේ කාටද (36 වගන්තිය)

1 - ඡන්දය භාවිතා කර අවසන් අයෙක්ද යන්න හඳුනා ගැනීම සඳහා උචිත සලකුණක් තිබේදැයි පරීක්ෂා කිරීමට ඉඩ නොදෙන තැනැත්තෙක්

2 - පරීක්ෂා කිරීමේදී උචිත සලකුණ තිබෙන බව ඔප්පු වන අයෙක්

3 - උචිත සලකුනින් සලකුණු කිරීමට ඉඩ ලබා නොදෙන අයෙක් යන අයට කිසිම ඡන්ද පත්‍රිකාවක් නිකුත් නොකරයි. එනම් ඔහුට ඡන්දය භාවිතා කිරීමට කිසිඳු ඉඩක් නොලැබෙයි.

එම පුද්ගලයාගේ නම/අංකය සහ ඡන්ද පත්‍රිකාවක් නිකුත් නොකල හේතුව දක්වා පලමු උපලේඛනයේ 'ඈ' ආකෘතියට අනුව ලේඛනයක් ස්ථානාධිපතිවරයා විසින් සකස් කල යුතුය.

## ඡන්දය දෙන ආකාරය (37 වගන්තිය)

ඡන්දදායකයා පළමුවෙන්ම තම අනන්‍යතාවය තහවුරු කල යුතුය. ඒ සඳහා ඔහු සතුව වලංගු හැඳුනුම්පතක් තිබිය යුතුය. ඒවා පහත පරිදි වේ.

(2013 වර්ෂය වන විට)

1. ජාතික හැඳුනුම්පත
2. සහකාර මැතිවරණ කොමසාරිස්වරයා නිකුත්කල තාවකාලික හැඳුනුම්පත
3. විදේශ ගමන් බලපත්‍රය
4. රියැදුරු බලපත්‍රය
5. විශ්‍රාමික හැඳුනුම්පත
6. පූජ්‍ය/පූජක හැඳුනුම්පත
7. දුම්රිය දෙපාර්තමේන්තු හැඳුනුම්පත

මෙම එක් හැඳුනුම්පත් එකක් මගින් අනන්‍යතාවය තහවුරුකල විට ඡන්ද පත්‍රිකාවක් නිකුත් කෙරේ.

ඡන්ද පත්‍රිකාව ලැබුනු විගස ඡන්දය ලකුණු කිරීමට සැකසූ ආවරණය කල ස්ථානයට යා යුතුය.

ඡන්දපොළ ස්ථානාධිපතිවරයා විසින් යම් ඡන්දදායකයෙකු අනවශ්‍ය තරම් වෙලාවක් ඡන්දය ලකුණු කිරීම සඳහා ගත නොකිරීමට අවශ්‍ය විධිවිධාන ගත යුතුය.

වෙනත් කිසිවකුට පෙනෙන ආකාරයෙන් ඡන්දය ලකුණු නොකල යුතුය. මුලින්ම තමා ඡන්දය දීමට කැමති දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කන්ඩායම ඉදිරියෙන් ඉඩ තබා ඇති කොටසෙහි කතිර (X) සලකුණ යෙදිය යුතුය.

ඉන්පසු තමන් මනාප ලකුණු කිරීමට අදහස් කරයි නම් තමන් කැමති අපේක්ෂකයින් තිදෙනෙකුට එම එක් එක් අපේක්ෂකයාගේ අංකය ඇතුලත් කොටුව මත පෙර පරිදිම කතිර (X) සලකුණ යෙදිය හැක.

ඉන්පසු එම ඡන්ද පත්‍රිකාවේ සලකුණු කල කිසිවක් නොපෙනෙන සේ නවා ඡන්ද පෙට්ටිය තුලට දැමිය යුතුය.

ඉන්පසු ඡන්දය භාවිතා කල තැනැත්තා අප්‍රමාදව ඡන්ද පොලෙන් බැහැරව යා යුතුය.

ඡන්ද හිමියා අතින් අවධානයක් නැති කමින් ඡන්ද පත්‍රිකාවක් නරක් වූයේ නම් එය නැවත ස්ථානාධිපතිවරයා වෙත දිය හැක. එම වැරදීම පිලිබඳ සෑහීමට පත්වන්නේ නම් වෙනත් ඡන්ද පත්‍රිකාවක් ඔහු වෙත නිකුත් කිරීමේ බලයක් ස්ථානාධිපතිවරයාට ඇත.

ඡන්දදායකයෙකු ඉල්ලා සිටින විටක ඡන්දය භාවිතා කරන ආකාරය පහදා දීමට ඡන්දපොළ ස්ථානාධිපතිවරයාට හෝ ඔහු විසින් බලය දුන් අයෙක්ට හැකියාව ඇත. නමුත් එම කටයුත්ත ඡන්ද පොල නියෝජිතයින්ට පෙනෙන හා ඇසෙන ලෙසත් කිසිදු පක්ෂයක් හෝ කණ්ඩායමක් තෝරා ගතයුතුය යන්න නොඇඟවෙන ආකාරයටත් සිදු කල යුතුය.

අන්ධ හෝ වෙනත් ශාරීරික ආබාධයක් සහිත ඡන්ද හිමියෙක් වෙනුවෙන් ඔවුන් විසින් ඉල්ලා සිටි විටක ස්ථානාධිපතිවරයා විසින් සිය කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ඉදිරියේ එම ඡන්ද පත්‍රිකාව එම ඡන්ද හිමියාගේ උපදෙස් මත සලකුණු කල හැක.

## බහු ඡන්දය (40 වගන්තිය)

1. එක් දිස්ත්‍රික්කයකට වඩා වැඩි ගණනකදී ඡන්දය දීම හෝ ඒ සඳහා ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටීම.
2. එකම දිස්ත්‍රික්කයක එක වතාවකට වඩා ඡන්දය දීම හෝ ඒ සඳහා ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටීම. නීතිවිරෝධී ක්‍රියාවකි.

## ඡන්ද පත්‍රිකාව ලැබීමට පෙර ප්‍රකාශයක් කිරීම (41 වගන්තිය)

යම් ඡන්දදායකයෙක්ගේ ඡන්දහිමිභාවය පිලිබඳ අවිනිශ්චිත බවක් ඇතිවිටක ඡන්ද ස්ථානාධිපතිවරයාගේ අභිමතය පරිදි යම් ඡන්ද හිමියෙකුට පලමු උපලේඛනයේ 'ඉ' 'ඊ' 'උ' ආකෘති වල සඳහන් ප්‍රකාශයන් එකක් හෝ කීපයක් කල යුතු යැයි නියම කල හැක.

එම ප්‍රකාශයන්හි සඳහන් වන්නේ තම නම ඡන්ද පොලෙහි තිබෙන නාම ලේඛනයේ තිබෙන නමම බව, එම ඡන්ද පොලේදී හෝ වෙනත් තැනකදී දැනටමත් ඡන්දය දී අවසන් නැති බව, ඡන්දය දීමේ යම් නුසුදුසුකමකට යටත් වී නොමැති බව යන කරුනුය.

එවැනි ප්‍රකාශනයක් කිරීම ප්‍රතික්ෂේප කරන්නෙකුට ඡන්ද පත්‍රිකාවක් නිකුත් නොකිරීමට ඡන්දපොළ ස්ථානාධිපතිවරයාට බලය ඇත.

දඬුවම - ඉහත ප්‍රකාශයක් කිරීමේදී සිතාමතාම යම් අසත්‍යයක් ප්‍රකාශ කර වරදකරු වන්නෙකුට රුපියල් පන්සියයක දඩයක් හෝ බරපතල වැඩ ඇතිව හෝ නැතිව මාස හයක සිරගත කිරීමක් හෝ ඒ දෙකම ලබා දීම.

## නරක් වූ ඡන්ද පත්‍රිකා (42 වගන්තිය)

යම් ඡන්ද හිමියෙකු විසින් අනවධානයෙන් ක්‍රියා කර තමන්ට ලැබුණු ඡන්ද පත්‍රිකාව භාවිතා කිරීමට නොහැකි තත්ත්වයකට පත්වුව හොත් එම නරක් වූ ඡන්ද පත්‍රිකාව ස්ථානාධිපතිවරයාට ලබා දී නැවත අලුත් ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටිය හැක. ඡන්ද පොලේ ස්ථානාධිපතිවරයා ඒ පිලිබඳව සෑහීමට පත්වන්නේ නම් නරක් වූ පත්‍රිකාව අවලංගු කර නැවත අලුත් ඡන්ද පත්‍රිකාවක් ලබා දේ.

## ද්විත්ව ඡන්ද පත්‍රිකා (43 වගන්තිය)

ඡන්ද පොලෙහි ඇති ඡන්ද නාම ලේඛනයේ නම් සඳහන් සහ ඒ වන විට එම ඡන්දය දමා අවසන් අවස්ථාවක එකී නම වෙනුවෙන්ම ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටින ඡන්ද හිමියෙක් වෙනුවෙන් නිකුත් කරන්නේ ද්විත්ව ඡන්ද පත්‍රිකාවකි.

එය ලබා දීමට ප්‍රථම පළමු උපලේඛනයේ 'උ9' ආකෘතිය අනුව ඡන්ද නාම ලේඛනයේ දැක්වෙන තැනැත්තා තමන්ම වන බවට ප්‍රකාශයක් කර එම තැනැත්තා විසින් එහි අත්සන් කල යුතුය.

එම පත්‍රිකාව අනෙක් ඡන්ද පත්‍රිකා වලට වෙනස් පාටකින් මුද්‍රණය කර ඇත.

එම ද්විත්ව ඡන්ද පත්‍රිකාව ඡන්ද පෙට්ටියට බහාලීමට පෙර එහි පිටුපස ඡන්ද හිමියාගේ නම සහ අංකය ස්ථානාධිපතිවරයා විසින් ලිවිය යුතුය.

## ඡන්ද විමසීම අවසන් කිරීම (44/45 වගන්ති)

ඡන්දය පැවැත්වෙන දින ප.ව 4.00 න් පසු කිසිදු තැනැත්තෙක් වෙත ඡන්ද පත්‍රිකාවක් නිකුත් කල නොහැක. නමුත් ඒ වෙලාව වන විටත් ඡන්ද පත්‍රිකා නිකුත් කර ඡන්ද පොල තුල ඡන්දය දැමීම පිණිස සිටින අයට එම වෙලාව පසු වුනත් තම ඡන්දය භාවිතා කල හැක.

ඡන්ද විමසීම අවසන් වූ පසු අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ඡන්ද පොළ ස්ථානාධිපතිවරයා විසින් ඡන්ද පොල නියෝජිතයින් බලා සිටියදී,

1 - ඡන්ද පත්‍රිකා ඇතුල් කරන ස්ථානය මුද්‍රා තැබූ ඡන්ද පෙට්ටි

2 - එක් එක් ඡන්ද පෙට්ටියේ යතුර

3 - පාවිච්චි නොකල සහ නරක් වූ ඡන්ද පත්‍රිකා

4 - ඡන්දහිමි නාම ලේඛනයේ ලකුණු කල පිටපත් සහ උප පත්‍රිකා

5 - ඡන්ද පත්‍රිකා නිකුත් නොකල ඡන්දදායක ලැයිස්තුව

6 - ද්විත්ව ඡන්ද පත්‍රිකා ලැයිස්තුව

යන ඒවා වෙන වෙනම පැකට්ටු වලට දමා තමාගේ මුද්‍රාව තැබිය යුතුය. මෙහිදී ඡන්ද පොල නියෝජිතයින්ටද අවශ්‍ය නම් එම පැකට්ටු වලට තම මුද්‍රාවන් තැබිය හැක.

ඉන්පසු ඒ සියල්ල ඡන්ද පොල ස්ථානාධිපතිවරයා විසින් 'ඡන්ද පත්‍රිකා විස්තරය' සමග ගණන් කිරීමේ නිලධාරියාට බාර දිය යුතුය.

## ඡන්ද පොලවල කලබල සහ ඡන්දය ශූන්‍ය කිරීම (46 වගන්තිය)

ඡන්ද පොල තුල සිදු වන යම් සිදුවීම් හෝ කලබල හේතුවෙන්,

1 - ඡන්ද විමසීම ආරම්භ කිරීම නියමිත වෙලාවට කල නොහැකි වූයේ නම්

2 - නියමිත වෙලාවට ආරම්භ කලද ප.ව 4.00 තෙක් පවත්වාගෙන යාමට නොහැකි වූයේ නම්

3 - ඡන්ද පෙට්ටියක් හෝ පෙට්ටි ගණන් කිරීමේ නිලධාරියාට බාර දීමට නොහැකි වූයේ නම්

ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ඒ විස්තර හැකි ඉක්මනින් තේරීම්භාර නිලධාරියාට දැනුම් දිය යුතු අතර ඔහු විසින් එය මැතිවරණ කොමසාරිස්වරයාට දැනුම් දිය යුතුය.

ඒ පිලිබඳව සෑහීමකට පත්වන විටක අදාල ඡන්ද පොලේ ඡන්දය ශූන්‍ය කිරීමට කොමසාරිස්වරයාට බලය ඇත.

එමෙන්ම,

1 - ඡන්ද පොල ස්ථානාධිපතිවරයාට පාලනය කල නොහැකි මට්ටමේ සිදුවීම් නිසා ඡන්ද කටයුතු ඉදිරියට පවත්වාගෙන යාමට නොහැකි වීම.

2 - ඡන්ද පොල නියෝජිතයින්ට පහරදීම, තර්ජනය කිරීම, පලවා හැරීම.

3 - මාර්ග අවහිර කිරීම නිසා ඡන්ද පොල කාර්ය මණ්ඩලයට ඡන්දපොළට පැමිණීමට නොහැකි වීම.

4 - ඡන්ද පොලේ සාමකාමී වාතාවරණය බිඳවැටෙන ක්‍රියා සිදුවීම.

5 - බලහත්කාරයෙන් ඡන්ද පෙට්ටි පිරවීම.

6 - සාමකාමී ඡන්දයක් පැවැත්වීමේ අභිලාෂය බිඳවැටෙන ක්‍රියා සිදුවීම.

යන කරුණුද එම ඡන්දපොළ ශූන්‍ය කිරීමට හේතු වේ.

ඡන්ද ගණන් කිරීම සම්පූර්ණ කල පසු සහ සියළුම භාරකාර නිලධාරීන්ගෙන් වාර්තා ලැබුනු පසු ශූන්‍ය කරන ලද ඡන්ද පොලවල ඡන්දය ගණන් නොකිරීමට ගත් තීරණය නිසා ඡන්ද විමසීමේ ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇති නොවන බවට කොමසාරිස්වරයාගේ මතය වන්නා වූ අවස්ථාවක අපේක්ෂකයින් සමග සාකච්ඡා කර ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කරනු ලැබිය යුතුය. ප්‍රතිඵලය කෙරෙහි එය බලපෑ හැකි බව කොමසාරිස්වරයාගේ මතය වන විට එවැනි ඡන්ද පොලවල අලුතින් ඡන්දය පැවැත්වීමට ඔහු විසින් නියෝග කල යුතුය.

## ඡන්ද ගණන් කිරීම

## ගණන් කිරීමේ නිලධාරීන් (47 වගන්තිය)

භාරකාර නිලධාරියා විසින් එක් එක් ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ ඡන්ද ගණන් කිරීමේ කටයුතු භාරව සිටීමට ගණන් කිරීමේ නිලධාරියෙකු සහ අවශ්‍ය වන ලිපිකරුවන් හා වෙනත් නිලධාරියෙකු පත් කරයි.

භාරකාර නිලධාරියාටද ගණන් කිරීමේ නිලධාරියෙකු ලෙස කටයුතු කල හැක.

## ගණන් කිරීම පිළිබඳ දැන්වීම (48 වගන්තිය)

ඡන්ද ගණන් කිරීම ඇරඹීමට පෙර භාරකාර නිලධාරියා විසින් පහත තොරතුරු තරඟ කරන ලද සියළු දේශපාලන පක්ෂවල ලේකම්වරුන්ට හෝ බලයලත් නියෝජිතයන්ටත් ස්වාධීන කණ්ඩායම්වල නායකයන්ටත් දැනුම්දිය යුතුය.

1. ගණන් කිරීමේ මධ්‍යස්ථාන පිහිටා ඇති තැන
2. ගණන් කිරීම ආරම්භ කරන දිනය සහ වෙලාව
3. ගණන් කිරීමේ මධ්‍යස්ථානයට වෙන් කරන ලද ඡන්ද පොළවල් ගණන පිළිබඳ ප්‍රකාශනයක්

## ගණන් කිරීමේ නියෝජිතයෝ (49 වගන්තිය)

තරඟ කරන ලද දේශපාලන පක්ෂයක ලේකම්වරයා හෝ බලයලත් නියෝජිතයා විසින් ද ස්වාධීන කණ්ඩායමක නායකයා විසින් ද

1. ඡන්ද පොළවල් එකකට වැඩි ගණනක ඡන්ද ගණන් කරනු ලබන මධ්‍යස්ථානයකට ගණන් කිරීමේ නියෝජිතයන් පස් දෙනෙකු
2. එක ඡන්ද පොළක පමණක් ඡන්ද ගණන් කරනු ලබන මධ්‍යස්ථානයකට ගණන් කිරීමේ නියෝජිතයන් දෙදෙනෙකු ඡන්ද ගණන් කිරීමේ නියෝජිතයින් ලෙස පත්කල හැක. ඔවුන් විසින්ම තමන් එසේ පත්කල නියෝජිතයන්ගේ සම්පූර්ණ නම්, ලිපිනයන් සහ ජාතික හැඳුන්ම්පත් අංකයන් දැක්වෙන ලිඛිත ප්‍රකාශයක් ගණන් කිරීමේ නිලධාරියාට භාර දිය යුතුය.

## ඡන්ද ගණන් කිරීම (50 වගන්තිය)

ඡන්ද විමසීම අවසන් වී සියළු ඡන්ද පොලවල ඡන්ද පෙට්ටි ලැබුණු පසු අප්‍රමාදව ගණන් කිරීම ආරම්භ කළ යුතුය. ඊට පෙර ගණන් කිරීමේ නිලධාරියා හෝ බලය දෙනලද අයෙක් විසින් විසින් ගණන් කිරීමේ නියෝජිතයන්ට

1. ඡන්ද පත්‍රිකා විස්තරය පෙන්විය යුතුය. (අවශ්‍යනම් එහි පිටපත් ගැනීමටද අවසර තිබේ)
2. එක් එක් ඡන්ද පෙට්ටිය පෙන්වා එය විවෘත කර එහි ඇති ඡන්ද පත්‍රිකා ගණන් කර එය වාර්තා ගත කළ යුතුය.

ඉන්පසු සියළුම ඡන්ද පෙට්ටිවල ඡන්ද පත්‍රිකා එකට මිශ්‍ර කරනු ලැබේ. එක් එක් පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායම්වලට ලැබී ඇති ඡන්ද පත්‍රිකා වෙන වෙනම තෝරා ඒවායේ ඉදිරිපස උඩු අතට සිටින සේ මිටි බැඳිය යුතුය. එම පත්‍රිකාවල පිටුපස අංකය කිසිසේත් කිසිවකුටත් නොපෙන්විය යුතුය.

යම් ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප කරන්නේ නම් "ප්‍රතික්ෂේප කරන ලදී" යන්න එහි පිටුපස ලිවිය යුතුය.

ද්විත්ව පත්‍රිකා ගණන් නොකර ඒවා ලැබී ඇති පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් අනුව වෙන වෙනම පැකට් කිරීම හා ඒ පැකට් වල ඒ ඒ පක්ෂයේ නම් හෝ ස්වාධීන කණ්ඩායම්වල නම් සටහන් කිරීම ද කළ යුතුය.

## ප්‍රතික්ෂේප කළයුතු ඡන්ද පත්‍රිකා (51 වගන්තිය)

1. නිල ලකුණ නොමැති ඡන්ද පත්‍රිකා
2. තරඟ කළ පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් අතරින් එකකට වැඩියෙන් කතිරය යෙදූ ඡන්ද පත්‍රිකා
3. ඡන්ද දායකයා හඳුනාගත හැකි ලකුණක් හෝ වෙනත් යමක් ලියා ඇති ඡන්ද පත්‍රිකා
4. ලකුණු නොකරන ලද ඡන්ද පත්‍රිකා
5. ලකුණු කිරීම අවිනිශ්චිත ඡන්ද පත්‍රිකා

## ඡන්ද ගණන් කිරීම (51 වගන්තිය)

ඡන්ද පත්‍රිකාව මත කතිරයක් නොවන වෙනත් ලකුණකින් ලකුණු කර තිබුනද ඡන්දහිමියාගේ ඡන්දය දීමේ චේතනාව එයින් පැහැදිලි වේ නම් එම ඡන්ද පත්‍රිකාව ප්‍රතික්ෂේප නොකල යුතුය.

නිල ලකුණක් නැති ඡන්ද පත්‍රිකාවක් හොරට මුද්‍රණය කරන ලද්දක් නොවේ නම් එය ප්‍රතික්ෂේප නොකල යුතු අතර ගණන් කිරීමේ නියෝජිතයන්ගෙන් ඒ ගැන අදහස් විමසා සිටිය යුතුය.

ගණන් කිරීමේ නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා ගණන වෙන වෙනම දැක්වෙන ප්‍රකාශයක් සකස් කර ගණන් කිරීමේ නියෝජිතයන් ඉල්ලා සිටියහොත් එහි පිටපත් ගැනීමට ඉඩදිය යුතුය.

එක් එක් දේශපාලන පක්ෂයකට හා ස්වාධීන කණ්ඩායමකට පක්ෂව ලැබී ඇති මුළු ඡන්ද ගණන ද ඒ ඒ අපේක්ෂකයාට ලැබී ඇති මනාප සංඛ්‍යාව ද වචනයෙන් හා ඉලක්කමෙන් දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර එය ගණන් කිරීමේ නිලධාරියා විසින් සහතික කර සහාය ලිපිකරුවන් එක් අයෙකුගේ හා ගණන් කිරීමේ නියෝජිතයන්ගේ අත්සන් සාක්ෂි වශයෙන් එයට ලබාගත යුතුය.

## මනාප (51 වගන්තිය)

එක් අපේක්ෂකයෙකුට දිය හැක්කේ එක් මනාපයක් පමණි.

අපේක්ෂකයන් තිදෙනෙකුට වැඩියෙන් මනාප ලකුණු කර ඇති ඡන්ද පත්‍රිකා ප්‍රතික්ෂේප නොකළ යුතු නමුත් මනාප ගණන් නොගනී.

එක් අපේක්ෂකයෙකුට එක් මනාපයකට වැඩියෙන් ලකුණු කර ඇති විට ඒ සියල්ල එක මනාපයක් ලෙස සැලකේ.

මනාපය ලකුණු කිරීම අවිනිශ්චිත වනවිට එම මනාපය ගනන් නොකරයි.

## නැවත ගනන් කිරීම (51 වගන්තිය)

ගණන් කිරීමේ නිලධාරියා විසින් අවශ්‍ය යැයි සලකන්නේ නම් වාර කීපයක් හෝ නැවත ගණන් කිරීම කළ හැක. ගණන් කිරීමේ නියෝජිතයින්ගේ ඉල්ලීම පිටද උපරිම වාර දෙකක් නැවත ගණන් කිරීම කල හැක. ඡන්ද පත්‍රිකා පිළිබඳ ගණන් කිරීමේ නිලධාරියාගේ තීරණය අවසාන තීරණය වේ.

## ගණන් කිරීම අවසන් කිරීම (52 වගන්තිය)

(1) ගණන් කරන ලද ඡන්ද පත්‍රිකා

(2) ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා

(3) ද්විත්ව ඡන්ද පත්‍රිකා

(4) ඡන්ද පත්‍රිකා විස්තරය

(5) පාවිච්චි නොකළ හා නරක් වූ ඡන්ද පත්‍රිකා

(6) ඡන්ද හිමි නාම ලේඛණයේ ලකුණු කළ පිටපත්

(7) ඡන්ද පත්‍රිකාවල උප ඡන්ද පත්‍රිකා

(8) ඡන්ද පත්‍රිකා භාර නොදුන් අයගේ ලැයිස්තුව

(9) ද්විත්ව ඡන්ද ලැයිස්තුව

(10) ගණන් කිරීම පිළිබඳ වාර්තාව

(11) ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා පිළිබඳ වාර්තාව

(12) එක් එක් දේශපාලන පක්ෂයටත් ස්වාධීන කණ්ඩායමටත් දී ඇති

ඡන්ද සංඛ්‍යාව පිළිබඳවත් එක් එක් අපේක්ෂකයා ලබාගෙන ඇති මනාප සංඛ්‍යාව දැක්වෙන වාර්තාව

යන ඒවා ගණන් කිරීමේ නිලධාරියා විසින් පැකට්ටුවල වෙන වෙනම බහා ඒවාට මුද්‍රා තබා තේරීම් භාර නිලධාරියාට භාර දිය යුතුය.

## තැපැල් ඡන්ද ගණන් කිරීම (54 වගන්තිය)

එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයෙහි තැපැල් ඡන්ද පත්‍රිකා වෙනම ඇති මධ්‍යස්ථානයකදී හෝ මධ්‍යස්ථාන ගණනාවකදී ගණන් කළ යුතුය.

තැපැල් ඡන්ද ගණන් කිරීමේදී මුලින් සඳහන් කර ඇති සාමාන්‍ය ඡන්ද ගණන් කිරීමේ කාර්ය පටිපාටිය අනුගමනය කෙරේ. එක් මධ්‍යස්ථානයකට ගණන් කිරීමේ නියෝජිතයන් එක් එක් පක්ෂයෙන්/කණ්ඩායමෙන් දෙදෙනෙකුට නොවැඩි ගණනක් පත් කළ හැක.

එක් එක් තැපැල් ඡන්ද පෙට්ටිය විවෘත කර එහි තුළ ඇති ලියුම් කවර ගණන් කර එක් එක් ලියුම් කවරය වෙන වෙනම විවෘත කළ යුතුය. වලංගු තැපැල් ඡන්ද පත්‍රිකා, අනන්‍යතා ප්‍රකාශ පත්‍ර සහ ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා බහාලීම සඳහා

1. තැපැල් ඡන්ද දායකයන්ගේ ඡන්ද පත්‍රිකා බඳුන
2. අනන්‍යතා ප්‍රකාශ සඳහා වූ බඳුන
3. තැපැල් ඡන්ද දායකයන්ගේ ප්‍රතික්ෂේප කරන ලද ඡන්දය සඳහා වූ බඳුන යනුවෙන් බඳුන් තුනක් සූදානම්ව තිබිය යුතුය.

## තැපැල් ඡන්ද ලියුම් කවර විවෘත කිරීම

1. අනන්‍යතා ප්‍රකාශයක් සහ ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක් හෝ අනන්‍යතා ප්‍රකාශයක් සහ ලියුම් කවරයක් තුළ බහා නොතිබූ ඡන්ද පත්‍රිකාවක් තිබුණහොත් ඒවා නිසි ලෙස එවා තිබේනම් අනන්‍යතා ප්‍රකාශය හා ඡන්ද පත්‍රිකාව හෝ ඡන්ද පත්‍රිකාව සහිත කවරය ඒවාට නියමිත බඳුන්වලට දැමිය යුතුය.
2. අනන්‍යතා ප්‍රකාශය පිළිබඳව සෑහීමට පත්විය නොහැකි නම් " අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී" යනුවෙන් එහි සටහන්

කර, එය එහි පැමිණ සිටින ගණන් කිරීමේ නියෝජිතයන්ට පෙන්වා යම් නියෝජිතයෙකු විරෝධය පෑවහොත් "ප්‍රතික්ෂේප කිරීමට විරෝධය පාන ලදී" යන්න ද එහිම සටහන් කර ඒ සමඟ එවා ඇති ඡන්ද පත්‍රිකාව හෝ ඡන්ද පත්‍රිකා කවරය ඊට අමුණා ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා සඳහා වූ බඳුනට දැමිය යුතුය.

3. අනන්‍යතා ප්‍රකාශය පමණක් ලියුම් කවරය තුළ තිබුණහොත් /" අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී. කිසිම ඡන්ද පත්‍රිකාවක් හෝ ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක් ලැබී නැත" යනුවෙන් ඒ මත සටහන් කර ප්‍රතික්ෂේප කළ ඡන්ද පත්‍රිකා බඳුනට එය දැමිය යුතුය.
4. ලියුම් කවරයක් නැතිව ඡන්ද පත්‍රිකාවක් පමණක් තිබුණහොත් "ප්‍රතික්ෂේප කරන ලදී. අනන්‍යතා ප්‍රකාශය ලැබී නැත" යනුවෙන් සටහන් කර ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා බඳුනට දැමිය යුතුය.
5. ඡන්ද පත්‍රිකා ලියුම් කවරය පමණක් එවා තිබුණහොත් එය විවෘත කර ඡන්ද පත්‍රිකාවක් සහ අනන්‍යතා ප්‍රකාශයක් එහි තුළ ඇත්නම් ඒවා සසඳා බලා නිවැරදි නම් අනන්‍යතා ප්‍රකාශය හා ඡන්ද පත්‍රිකාව අදාළ බඳුන්වලට දැමිය යුතුය. එසේ නොවුවහොත් "අනන්‍යතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලදී" යන්න සටහන් කර නියෝජිතයන්ට ද පෙන්වා විරෝධතාවක් දැක්වුවහොත් ඒ බව ද සටහන් කර ඡන්ද පත්‍රිකාවද අමුණා ප්‍රතික්ෂේප කරන බඳුනට දැමිය යුතුය.
6. ලියුම් කවරය විවෘත කරන විට අනන්‍යතා ප්‍රකාශය හෝ ඡන්ද පත්‍රිකාව හෝ පමණක් තිබුණහොත් නැත්නම් කිසිවක් ඒ තුළ නොතිබුණහොත් අදාළ සටහන් යොදා ප්‍රතික්ෂේප කිරීමේ බඳුනට දැමිය යුතුය.
7. කවරය තුළ කිසිවක් නොතිබුණහොත් "ප්‍රතික්ෂේප කරන ලදී. ලියුම් කවරයෙහි කිසිවක් නැත" යන්න සටහන් කර ප්‍රතික්ෂේප කිරීමේ බඳුනට දැමිය යුතුය.
8. ඉන්පසු ඡන්ද පත්‍රිකා බඳුනෙහි එක් එක් කවරය විවෘත කර කවරයෙහි අංකය හා ඡන්ද පත්‍රිකාවේ අංකය ගැළපෙන්නේ නම් ඡන්ද පත්‍රිකාවන් ගොඩට දැමිය යුතුය.
9. කවරයේ අංකය, ඡන්ද පත්‍රිකාවේ අංකය හා නොගැළපෙන්නේ නම් හෝ ඇතුළෙහි ඡන්ද පත්‍රිකාව නැත්නම් අදාළ සටහන් යොදා ප්‍රතික්ෂේප කිරීමේ ගොඩට දැමිය යුතුය.

## තැපැල් ඡන්ද ගණන් කිරීම

වලංගු තැපැල් ඡන්ද පත්‍රිකා ගණන් කර එක් එක් පක්ෂය හා කණ්ඩායම් ලැබූ ඡන්ද ගණනත් ඒ ඒ කණ්ඩායම් අපේක්ෂකයන් ලැබූ මනාප සංඛ්‍යාවත් දක්වන වාර්තාවක් සකස් කර එම වාර්තාව ද,

1. ගණන් කරන ලද ඡන්ද පත්‍රිකා
2. ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා
3. ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා පිළිබඳ ප්‍රකාශය
4. අනන්‍යතා ප්‍රකාශ හා ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද බඳුන්වල ඇති වෙන වෙනම සකස් කළ පැකට් දෙක
5. ගණන් කිරීම පිළිබඳ වාර්තා

වෙන වෙනම මුද්‍රා තබා තේරීම්භාර නිලධාරියා වෙත යැවිය යුතුය. තේරීම්භාර නිලධාරියා විසින් එම පැකට්ටු විවෘත කිරීමට පෙර එහි මුද්‍රා පරීක්ෂා කිරීම සඳහා ප්‍රතිඵල නිකුත් කරන ස්ථානයේ සිටින නියෝජිතයින්ට ඉල්ලා සිටිය හැක. (18-28 රෙගුලාසි)

## ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම (58 වගන්තිය)

ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරනු ලබන වේලාව සහ ස්ථානය පිළිබඳව ලියවිල්ලකින් වූ දැන්වීමක් තරඟ කළ දේශපාලන පක්ෂවල සහ පක්ෂවල ලේකම්වරුන්ට හෝ බලයලත් නියෝජිතයන්ටත් ස්වාධීන කණ්ඩායම්වල නායකයන්ටත් තේරීම්භාර නිලධාරියා විසින් ප්‍රතිඵල ප්‍රකාශ කිරීමට පෙර දැනුම් දිය යුතුය.

පරිපාලන දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීමට අපේක්ෂකයන් ඉදිරිපත් කරන ලද සෑම පක්ෂයක් විසින් ද ස්වාධීන කණ්ඩායමක් විසින් ද ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරනු ලබන ස්ථානයට පැමිණ සිටීම සඳහා නියෝජිතයන් දෙදෙනෙකු බැගින් පත් කරනු ලැබිය හැකිය. පත් කිරීමේ ලියවිල්ලේ එක් එක් නියෝජිතයාගේ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය ද ඇතුළත් කර පක්ෂයේ ලේකම් හෝ බලයලත් නියෝජිතයා විසින් ද ස්වාධීන කණ්ඩායමක නායකයා විසින් ද ප්‍රතිඵල ප්‍රකාශ කිරීමට පෙර තේරීම්භාර නිලධාරියාට භාර දිය යුතුය.

දිස්ත්‍රික්කයේ සියළුම ගණන් කිරීමේ මධ්‍යස්ථානවලින් තේරීම්භාර නිලධාරියා වෙත එවන ලද වාර්තාවක් අනුව එක් එක් කණ්ඩායම් ලැබූ ඡන්ද සංඛ්‍යාව ද එක් එක් අපේක්‍ෂකයා ලැබූ මනාප සංඛ්‍යාවද දෙන ලද මුළු ඡන්ද සංඛ්‍යාව ද, වලංගු ඡන්ද සංඛ්‍යාව ද වෙන වෙනම එකතු කර ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළ යුතුය.

තරඟ කරන ලද එක් එක් කණ්ඩායමට සමානුපාතිකව හිමි විය යුතු මන්ත්‍රීන් සංඛ්‍යාව තීරණය කිරීමේ දී අනුගමනය කළ යුත්තේ පහත දැක්වෙන ක්‍රමය යි.

## ලැබිය යුතු මන්ත්‍රී සංඛ්‍යාව (58 වගන්තිය)

මුළු දිස්තික්කයෙන්ම ලැබුණු සියළුම වලංගු ඡන්ද ගණන (අදාල ඡන්ද සංඛ්‍යාව) ඒ දිස්ත්‍රික්කයෙන් තෝරාගත යුතු මන්ත්‍රීවරුන් ගණනින් බෙදිය යුතුය. එවිට සාමාන්‍යයෙන් මන්ත්‍රීවරයෙකු වීමට එක් අපේක්‍ෂකයෙකු ගත යුතු සංඛ්‍යාව (සම්ප්‍රයුක්ත සංඛ්‍යාව) තීරණය කළ හැකිය. එම සම්ප්‍රයුක්ත සංඛ්‍යාවෙන් එක් එක් පක්ෂ/කණ්ඩායම් ලැබූ ඡන්ද ගණන බෙදූ විට ඒ ඒ කණ්ඩායමෙන් තෝරා ගත යුතු මන්ත්‍රීන් සංඛ්‍යාව තීරණය වෙයි. මෙම අවස්ථාවේදී එසේ බෙදීමෙන් ඉතිරිවන අගය සලකා නොබැලේ.

ඉන්පසුද තවත් මන්ත්‍රීවරුන් තෝරා ගැනීමට තිබේනම් කලින් බෙදීමේදී ශේෂ වූ ඡන්ද සංඛ්‍යාව සහ එකඳු අපේක්ෂකයෙක් හෝ පත්කර ගැනීමට ඉඩ ලැබී නැති පක්ෂ හෝ කන්ඩායම් සලකා බලා වැඩි ඡන්ද ගණනක් ලබා ඇති අනු පිළිවෙල අනුව හිඟ මන්ත්‍රීන් ප්‍රමාණය තෝරා පත් කර ගනී. ඉන්පසු ඒ ඒ කණ්ඩායමෙන් පත් විය යුතු අපේක්‍ෂකයන් තීරණය කළ යුතුයි. යම් කණ්ඩායම්හි ශේෂ සංඛ්‍යාවන් සමාන වුවහොත් කුසපත් ඇදීමෙන් තීරණය කළ යුතුය.

යම් හේතුවකින් ඡන්ද දායකයන් මනාප ලකුණු කර නැත්නම් ලැයිස්තුවෙන් තෝරාපත් කර ගත යුත්තේ කවර අපේක්‍ෂකයන්දැයි කණ්ඩායමේ නායකයාගෙන් හෝ පක්‍ෂයේ ලේකම්ගෙන් විමසිය යුතුය. තේරීම්භාර නිලධාරියාගේ විමසුමට කණ්ඩායමේ නායකයා හෝ පක්‍ෂයේ ලේකම් තීරණයක් නොදුන්නහොත් ලැයිස්තුවේ නම්වල මුල සිට අනුපිළිවෙල අනුව නියමිත සංඛ්‍යාව තෝරා පත් කිරීමට තේරීම්භාර නිළධාරියාට බලය ඇත.

ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමෙන් පසු ප්‍රතිඵල වාර්තාව විධිමත්ව සකස් කර තේරීම් භාර නිලධාරියා විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත යැවූ විට එය ගැසට් පත්‍රයේ පළ කළ යුතුයි.

## ප්‍රතිලාභ (බෝනස්) ආසන (61 වගන්තිය)

සියළු තේරීම්භාර නිලධාරීන්ගෙන් කොමසාරිස්වරයාට වාර්තා ලැබීමෙන් අනතුරුව ඔහු විසින් අදාල පලාතෙහි වැඩිම ඡන්ද ලැබූ පක්ෂයට/කන්ඩායමට බෝනස් ආසන දෙකක් වෙන් කරනු ලැබේ. මෙහිදී එම ආසන සඳහා පත්කරන්නේ තම නාමයෝජනා ලයිස්තුවේ කුමන අපේක්ෂකයන්ද යන්න තීරනය කරනු ලබන්නේ දේශපාලන පක්ෂයක නම් එහි ලේකම්වරයාද ස්වාධීන කණ්ඩායමක නම් එහි කන්ඩායම් නායකයා විසින්ද වේ.

තේරීම්භාර නිලධාරියා වෙත භාර දෙන ලද ඡන්ද විමසීමට අදාළ පැකට්ටු ඒවා ලැබී මාස හයක් ඉකුත් වූ පසු විනාශ කළ යුතුය.

ඡන්ද පෙත්සමක් සම්බන්ධව අභියාචනාධිකරණයේ නියෝගයක් අනුව මිස ඡන්ද විමසීමට සම්බන්ධ මොනම පැකට්ටුවක් හෝ විවෘත කර බැලීමට කිසිවෙකුට අවසරයක් නැත.

## මන්ත්‍රී පුරප්පාඩු (62 වගන්තිය)

1. පළාත් සභාවක අපේක්ෂකයෙකු වීමේ නුසුදුසුකමක් පළාත් සභාවට තේරී පත්වීමෙන් පසු ඇති වීම.
2. ඉල්ලා අස්වීම.
3. තමා තේරී පත් වූ දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ සමාජිකත්වය ඉල්ලා අස්වීමෙන් හෝ පහ කිරීමෙන් හේ වෙනත් හේතුවක් නිසා අහිමි වුවහොත් එසේ අහිමි වී මාසයක් ගත වූ විටකදී
4. මරණයට පත්වීම

යන හේතු මත පළාත් සභාවක මන්ත්‍රීවරයෙකුගේ අසුන හිස් වන්නේය.

එහෙත් යම් පක්ෂයකින් හෝ කණ්ඩායමකින් පහ කළ අවස්ථාවක මාසයක් ඇතුළත අභියාචනාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරමින් ඊට විරෝධය පල කළහොත් එහි තීරණය ලැබෙන තුරු මන්ත්‍රීධූරය දැරිය හැකිය. පහ කිරීම වලංගු බව තීරණය කළහොත් තීරණයේ දින සිට මන්ත්‍රී ධූරය හිස් වේ.

පළාත් සභාවේ මන්ත්‍රීධූරයක් හිස් වූ අවස්ථාවක ඒ බව පළාත් සභාවේ ලේකම්වරයා විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත දැනුම් දිය යුතුය. ඒ අනුව මැතිවරණ කොමසාරිස් විසින් පුරප්පාඩුව ඇති කළ මන්ත්‍රීවරයා අයත්ව සිටි දේශපාලන පක්ෂයේ ලේකම්ගෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන් ඒ පුරප්පාඩුව සඳහා සුදුස්සෙකු නම් කරන ලෙස ඉල්ලා සිටිය යුතුය. ඒ ඉල්ලීම අනුව කෙනෙකු නම් කළහොත් ඒ තැනැත්තා මන්ත්‍රීධූරයට නම් කළ යුතුය. නියමිත කාලය තුළ නමක් යෝජනා නොකළහොත් පුරප්පාඩුව ඇති කළ මන්ත්‍රීවරයා අයත්ව සිටි කණ්ඩායම් ලැයිස්තුවේ තේරී පත් නොවූ අයගෙන් වැඩිම මනාප ලැබූ තැනැත්තා ඒ තනතුරට පත් වේ.

## අතුරු මැතිවරණයක් පැවැත්වීම (65 වගන්තිය)

පහත සඳහන් අවස්ථාවන් හිදී කොමසාරිස්වරයා විසින් කරන ලද දැනුම්දීමක් අනුව ජනාධිපවරයා විසින් පුරප්පාඩුවක් පිරවීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්විය හැකිය.

1. නාමයෝජනා පත්‍රයෙහි පුරප්පාඩු පිරවීම සඳහා නමක් ඉතිරි වී නැති අවස්ථාවක
2. නම් ඉතිරි වී තිබුණත් ඔවුන්ට එකම මනාපයක් හෝ නැති විට
3. පුරප්පාඩු ඇති කළ මන්ත්‍රීවරයා ඒ පරිපාලන දිස්ත්‍රික්කයෙන් තෝරාපත් කර ගනු ලැබූ මන්ත්‍රීවරයෙකු නොවන අවස්ථාවක

## ඡන්ද පෙත්සම් (91 වගන්තිය)

යම් දිස්ත්‍රික්කයක ඡන්ද විමසීමක් නිසි අන්දමින් නොපැවැත්වූ බවත්, අපේක්ෂකයින් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් ඡන්ද විමසීමට සම්බන්ධව දූෂණ ක්‍රියාවන් ඇති කර බවත් කියා සිටින අවස්ථාවක ඡන්ද විමසීම නිශ්ප්‍රභා කරන ලෙස ඡන්ද පෙත්සමක් මගින් ඉල්ලා සිටිය හැක. එය ඉදිරිපත් කල යුත්තේ අභියාචනාධිකරණයටය. එවැනි පෙත්සමක්

ඉදිරිපත් කළ හැක්කේ ඒ ඡන්ද විමසීමේදී අපේක්ෂකයෙකුව සිටි අයකුට හෝ තෝරා පත් කර ගැනීමට අයිතියක් තිබුණා යැයි ප්‍රකාශ කරන සිටින අයෙකුට පමණි.

ඡන්ද ප්‍රතිඵල ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කිරීමෙන් දින 21 ක් අතුළත පෙත්සමකින් හා දිවුරුම් පෙත්සමකින් මෙම අභියාචනය කළ යුතුය.

මන්ත්‍රීවරයෙකු විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් කරන ලදැයි කියන දූෂණ ක්‍රියාවක් හෝ ඊට ආධාරයක් වශයෙන් ප්‍රතිඵල ගැසට් කිරීමෙන් පසුව යම් මුදල් ගෙවීමක් කර ඇති බව කියා සිටින ඡන්ද පෙත්සමක් ඒ මුදල් ගෙවීම කරන ලද දිනයේ සිට දින 26 ක් ඇතුළත කරනු ලැබිය හැකිය.

## පෙත්සමක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය හේතු (92 වගන්තිය)

දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම සම්පූර්ණයෙන් අවලංගු කරන ලෙස ඉල්ලා සිටිය හැකි අවස්ථා,

1. අල්ලස් දීම, සංග්‍රහ කිරීම, බිය ගැන්වීම හෝ වෙනත් විෂමාචාරයන් නිසා ඡන්ද හිමියන්ගෙන් යම් කොටසකට ඔවුන්ගේ කැමත්ත අනුව ඡන්දය දීමෙන් වැළකී සිටීමට සිදු වූ නිසා ඡන්ද ප්‍රතිඵල කෙරෙහි බලපෑමක් සිදුව තිබීම.
2. ඡන්ද විමසීමේ නීතිය අනුව එය නොපැවැත් වූ නිසා ප්‍රතිඵල කෙරෙහි බලපෑමක් ඇතිව තිබීම.

කිසියම් මන්ත්‍රීවරයෙකුගේ තේරී පත්වීම නිශ්ප්‍රභා කරන ලෙස ඉල්ලා සිටිය හැකි අවස්ථා.

1. අපේක්ෂකයා විසින් හෝ ඔහුගේ අනුදැනුම ඇතිව ඔහුගේ නියෝජිතයෙකු විසින් හෝ ඡන්ද විමසීම සම්බන්ධයෙන් නීති විරෝධී හෝ දූෂණ ක්‍රියාවක් කර ඇති විට.
2. අපේක්ෂකයාගේ ප්‍රචාරක කටයුතු සඳහා යොදා ගත් තැනැත්තෙකු ඊට පෙර අවුරුදු හතක් ඇතුළත මැතිවරණ දූෂණ ක්‍රියාවකට අධිකරණයක් මගින් වරදකරුවකු බවට තීරණය කර තිබීම.
3. ප්‍රජා අශක්නුතාවකට පත් කරන ලද්දෙකු ඒ කාලය ගෙවීයාමට පෙර ඡන්ද විමසීමේ ආධාරකරුවෙකු ලෙස යොදා ගෙන තිබීම.
4. ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශ කරන ලද අවස්ථාවේ ඒ තැනැත්තා මන්ත්‍රීවරයෙකු වශයෙන් පත් කර ගැනීමට නුසුදුස්සෙකුව සිටීම.

## පෙත්සමෙන් ඉල්ලා සිටිය හැකි සහන (96 වගන්තිය)

1. දිස්ත්‍රික්කයේම ඡන්ද විමසීම අවලංගු වූ බවට ප්‍රකාශයක් හෝ
2. තේරී පත් වී ඇති අයකු නිසි ලෙස පත් වී නැති බවට ප්‍රකාශයක් හෝ
3. යම් අපේක්ෂකයෙකු නිසි ලෙස තේරීපත්ව ඇති බවට ප්‍රකාශයක්

පෙත්සමෙහි පාර්ශවකරුවන් කළ යුතු අය (97 වගන්තිය)

1. තෝරා පත් කරගෙන ඇති අපේක්ෂකයන් සියළුදෙනාම හෝ ඔවුන් අතුරෙන් යමෙකු පත්කරගෙන තිබීම අවලංගු බවත් ඒ නිසා ඒ අය වෙනුවට තමා හෝ වෙනත් අපේක්ෂකයෙකු පත්වී ඇති බවට තීන්දුවක් ඉල්ලා සිටින්නේ නම් පෙත්සම්කරු හැර තරඟ කල සියළුදෙනාම වගඋත්තරකරුවන් කළ යුතුය.
2. එසේ වෙනත් අපේක්ෂකයන් තේරීපත් වූ බවට තීන්දුවක් ඉල්ලා නොසිටින්නේ නම් පාර්ශවයක් කලයුත්තේ තේරී පත් වූ අපේක්ෂකයන් පමණි.
3. දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් තමා විසින් චෝදනා කරනු ලබන අපේක්ෂකයා හෝ තැනැත්තා.
4. එසේම පෙත්සමෙහි වග උත්තරකරුවකු කර නැති යම් අපේක්ෂකයෙකුට විනිසුරුවරයාගේ අවසරය ලබාගෙන පෙත්සමෙහි වග උත්තරකරුවෙකු විය හැකිය. එහිදී ඇපයක් තබන ලෙස නියම කරනු ලැබුවහොත් එසේ කළ යුතුය.

## පෙත්සමෙහි සඳහන් කළ යුතු කරුණු (98 වගන්තිය)

1. තමා ඡන්ද විමසීමේදී අපේක්ෂකයෙකුව සිටි බැවින් පෙත්සම ඉදිරිපත් කිරීමට තමාට අයිතියක් ඇති බව.
2. ඡන්ද විමසීම පැවැත්වූ බව සහ එහි ප්‍රතිඵලය.
3. පෙත්සම ඉදිරිපත් කරන්නා විශ්වාසය තබා සිටින වැදගත් කරුණු පිළිබඳව සංක්ෂිප්ත ප්‍රකාශයක්.
3. දූෂණ හා නීති විරෝධී ක්‍රියාවන් කරන ලද පාර්ශවකරුවන්ගේ නම් හා ඒ ක්‍රියාවන් සිදු කළ දිනය හා ස්ථානයන් පිළිබඳ විස්තරයක් හා ඒවා සනාථ කරන දිවුරුම් ප්‍රකාශයක්.

4. සමස්ථ පරිපාලන දිස්ත්‍රික්කයේම ඡන්ද විමසීම අවලංගු කළ යුතුද නැතහොත් යම් මන්ත්‍රීවරයෙකුගේ පත්වීම අවලංගු කළ යුතු ද යන ආයාචනය (සාක්ෂි සඳහන් කළ යුතු නැත)
5. සියළුම පෙත්සම්කරුවන් විසින් අත්සන් කර තිබීම.

ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කරන ලද දිනයේ සිට මාස හයක් ඇතුළත විභාග කර තීන්දු කළ යුතුය.

මැතිවරණ පෙත්සමක් සඳහා දුන් තීන්දුවකට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට ද නැවත අභියාචනයක් කිරීමේ අවස්ථාවක් පවතී. අභියාචානාධිකරණයේ තීන්දුව දී මාසයක් ගතවීමට පෙර පෙත්සම්කරු විසින් හෝ වග උත්තරකරුවෙක් විසින් එය කළ හැකිය.

ශ්‍රේෂ්ඨාධිකරණයේදී අභියාචනාධිකරණයේ තීරණය අනුමත කළහොත් අභියාචනාධිකරණයෙන් එවන ලද සහතිකය හා වාර්තාව හෝ අභියචානාධිකරණයේ තීරණය වෙනස් කළහොත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පිළියෙල කළ වාර්තාව ජනාධිපතිවරයා වෙත යැවිය යුතුය.

ශ්‍රේෂ්ඨාධිකරණයේදී අභියාචානාධිකරණ වාර්තාව හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තාව ජනාධිපතිවරයා වෙත ලැබුණු විට, ඒ වාර්තාව අනුව ඒ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම අවලංගු යැයි ප්‍රකාශ කළ යුතු නම් ඒ සහතිකය ලැබී මාසයක් ඇතුළත ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නිවේදනයකින් නැවත ඡන්ද විමසීමක් පවත්වන ලෙස නියම කළ යුතුය.

අධිකරණයේ වාර්තාව තමන් වෙත ලැබුණු විට ජනාධිපතිවරයා විසින් එය ගැසට් පත්‍රයේ පළකළ යුතුය. යම් අපේක්ෂකයෙකු දූෂණ හා නීති විරෝධී ක්‍රියාවකට සම්බන්ධ බව වාර්තාවෙන් තීන්දු කර ඇත්නම් ඔහුගේ නම නාමයෝජනා පත්‍රයෙන් කපා දැමීම තේරීම්භාර නිලධාරියා විසින් කළ යුතුය. ඔහුගේ නාමය ඡන්ද ලේඛණයෙන් කපා හැරීම ලියාපදිංචි කිරීමේ නිලධාරියා විසින් කළ යුතුයි.

## IN RE THE THIRTEENTH AMENDMENT TO THE CONSTITUTION AND THE PROVINCIAL COUNCILS BILL

SUPREME COURT.
S. SHARVANANDA, C.J., R. S. WANASUNDERA, J.,
P. COLIN-THOME, J., K. A. P. RANASINGHE, J.,
E. A. D. ATUKORALE, J, H. D. TAMBIAH, J.,
L. H. DE ALWIS, J., O. S. M. SENEVIRATNE, J.,
AND H. A. G. DE SILVA, J.,

*Thirteenth Amendment to the Constitution-Provincial Councils Bill-Presidential Reference-Articles 18, 76, 83, 120, 121, and 138 of the Constitution-Referendum-Chapter XVIIA, Articles 154A to T.*

The President referred two Bills entitled "Thirteenth Amendment to the Constitution A Bill to amend the Constitution of the Democratic Socialist Republic of Sri Lanka" and Provincial Councils Bill" to the Supreme Court under Article 121 of the Constitution.

The Thirteenth Amendment sought to amend the provisions in the Constitution relating to language (Article 18), jurisdiction of the Court of Appeal by addition of jurisdiction to review orders of the High Court made in its new appellate jurisdiction (Article 138 (1) and by the addition of a new Chapter XVIIA and Articles 154A to 154T relating to the executive, administrative and legislative powers of Provincial. Councils and the power of amendment, overriding or repealing them vested in Parliament.

**Determination:** (Per Sharvananda, C.J., Colin-Thome". J., Atukorale, J. and Tambiah, J.)

Neither the Provincial Councils Bill nor any provisions of the Thirteenth Amendment to the Constitution requires approval by the People at a Referendum by virtue of the provisions of Article 83. Once the Bill is passed by a 2/3 majority and the Constitution amended accordingly the Provincial Councils Bill will not be inconsistent with the so amended Constitution.

The Unitary character of the State of which the characteristics are the supremacy of the central Parliament and the absence of subsidiary sovereign bodies remains unaffected. The Provincial Councils do not exercise sovereign legislative power and are only subsidiary bodies exercising limited legislative power subordinate to that of Parliament. Parliament has not there by abdicated or in any manner alienated its legislative power. Delegated legislation is legal and permitted and does not involve any abandonment or abdication of legislative power in favour of any newly created legislative authority.

The concept of devolution is used to mean the delegation of Central Government power without the relinquishment of supremacy. Devolution may be legislative or administrative or both and should be distinguished from decentralization. The scheme of devolution set out in the Bills does not erode the sovereignty of the People and does not require the approval of the People at a Referendum.

Ranasinghe, J. agreed with the above determination but held that the provisions of clauses 154 (2) (b and (3) (b) of the Bill to amend the Constitution (Thirteenth Amendment) require approval by the People at a Referendum.

**Wanasundera, J., L. H. de Alwis, J., Seneviratne, J. and H. A. G. de Silva, J.,** dissented and determined that both Bills in their totality required the approval of the people at a Referendum.